සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
පස්වැනි කලාපය, ද්විතීය භාගය, 2010 ජනවාරි , 225-246
ISSN 1800-1459

# ශ්‍රී ලංකාවේ දෙවන තරුණ නැගී සිටීම (1988 - 1989) හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

කේ. එම්. චාමින්ද බණ්ඩාර

ඉතිහාස අධ්‍යයන අංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර.

**සාරාංශය**

ශ්‍රී ලාංකේය ඉතිහාසයෙහි තරුණ නැඟී සිටීම් සම්බන්ධයෙන් ක්‍රිව 1971 සහ 1988-89 යන කාල පරිච්ඡේදය සුවිශේෂ තැනක් හිමිකර ගනියි. යථෝක්ත නැගීසිටීම් වනාහි හුදෙක් තනි දේශපාලන, ආර්ථික, සමාජ හේතු සාධකයක ප්‍රතිඵල නොව ඒවා එකී හේතු සාධක කීපයක සමුච්චිත ප්‍රතිඵලයකි. නැතහොත් එම සාධක කීපයක් එකතුවෙන් ජනිත වූ සිදුවීම් වේ. 1971 මෙන් ම 1988 - 1989 කැරැල්ල සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණ සෘජු ව ම වගකිවයුතු යි යන්න ප්‍රකාශ කිරීම නිවරදි වුවත් එකී කැරලි සම්බන්ධයෙන් අප තුළ තවමත් නිරාකරණය නොවූ ගැටළු රාශියක් වේ. එනම්, එකී කැරලිවලට ජ. වි. පෙ. පමණක් ම සම්පූර්ණයෙන් ම වගකිව යුතු ද? ජනතා විමුක්ති පෙරමුණ කැරලිකාර තත්වයට ඇද දැමීම හා සම්බන්ධ කරුණු මේ සමාජය කෙරෙන් නිර්මාණය වී තිබුණේ ද?. මේ සම්බන්ධයෙන් පාලක පන්තියේ සම්බන්ධය කවරාකාර ද? මෙරට තරුණයන් වරක් නොව දෙවරක් ම ජ. වි. පෙ. නායකත්වය යටතේ එක ම ආකාරයේ යම්යම් ප්‍රමාණාත්මක වෙනස්කම් සහිත ව සන්නද්ධ අරගලයන්ට ගියේ මන් ද? ඒ සඳහා ඉවහල් වූ සාධාරණ හේතු සමාජය තුළ පැවතියා නම් ඒ මොනවා ද? ආදී වශයෙන් එකිනෙකට සම්බන්ධ වූ ගැටළු රාශියකි. එහෙයින් මෙම මාතෘකාව සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම බෙහෙවින් වැදගත් මෙන්ම යළිදු එවැන්නක් ඇති වීමට ඉඩ ප්‍රස්තාවක් පවතී ද යන්න අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. මෙම ශාස්ත්‍රීය කර්තව්‍යයේ දී මූලාශ්‍රයන් වශයෙන් භාවිතයට ගැනෙනුයේ මෙම මාතෘකාව තේමා කොටගෙන විවිධ විද්වතුන් විසින් ලියන ලද ශාස්ත්‍රීය ග්‍රන්ථයන්, අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා වාර්තා, බන්ධනාගාර රැඳවුම්කරුවන් පිළිබඳ වාර්තා, සඟරා සහ පුවත්පත් ලිපි ආදීන් ය. එකී ක්‍රමවේද භාවිතකර 1988 - 1989 තරුණ නැඟී සිටීමට බලපෑ දේශපාලන හේතුන් කෙරෙහි පමණක් අවධානය යොමුකිරීම අපගේ පරමාර්ථය යි.

**කේන්ද්‍රීය වචන** : දෙවන තරුණ නැඟී සිටීම, තරුණ අසහනය, දේශපාලනික පසුබිම, ජනතා විමුක්ති පෙරමුණ, දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය

## හැඳින්වීම

ප්‍රචණ්ඩකාරී තරුණ නැඟී සිටීමකට පමණක් නොව ඕනෑ ම ඓතිහාසික සිද්ධියකට බලපාන ලද ප්‍රධාන හේතු අධ්‍යයනය කිරීමේ දී ඊට ම ඉවහල් ඓතිහාසික සිදුවීම් සොයාබැලීම බෙහෙවින් වැදගත් ය. ශ්‍රී ලංකාවට බටහිර ජාතියක් පළමු වරට පැමිණෙන්නේ ක්‍රි.ව 1505 දී ය. ඒ පෘතුගීසීන් ය. එතැන් පටන් 1815 උඩරට ගිවිසුම මඟින් ශ්‍රී ලංකාව ම බටහිර ආධිපත්‍යයට යටත් වනතෙක් සියවස් තුනකට අධික කාලයක් ලංකාවේ මුහුදු බඩ පළාත් පෘතුගීසීන්ගේ ග්‍රහණයට යටත් ව පැවතුණි. 1815 න් පසුව මුළු ලංකාව ම බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් විය. පෘතුගීසි හා ලන්දෙසි බලපෑම් ඇති වූ කාලයේ දී සහ ඉන්පසු බ්‍රිතාන්‍යට යටත් වී ක්‍රි.ව. 1833 දක්වාත් ලංකාවේ සමාජ ක්‍රමයේ සැලකිය යුතු වෙනසක් ඇත් නො වී ය. නමුත් ශ්‍රී ලංකාව මුළුමනින් ම යටත් විජිතයක් බවට පත්කර ගැනීමෙන් පසු බ්‍රිතාන්‍යයන් මෙරට පැවති

සමාජ ආර්ථික ක්‍රමය වෙනස් කර එමඟින් සිය අරමුණු සාර්ථක ව ඉටුකර ගැනීම සඳහා නොයෙක් සමාජ ආර්ථික ප්‍රතිසංස්කරණ මෙරටට හඳුන්වා දෙන ලදී. 1833 දී ඔවුහු කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන්හ. මෙමඟින් ලංකාවේ ක්‍රියාත්මක කුල වැඩවසම් ක්‍රමය වෙනුවට වැවිලි ක්‍රමය මත පදනම් වූ ආනයන අපනයන ආර්ථික ක්‍රමයක් මෙරටට හඳුන්වා දෙන ලදී. ඒ හරහා ලංකාවේ ආර්ථික ක්‍රියාවලිය ලෝක ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ කරනු ලැබී ය. ඒ සමඟ මෙකී ආර්ථික ක්‍රියාවලිය හේතු කොටගෙන මෙරට නව සමාජ පන්තියක් ද බිහිවනු දැකිය හැකි ය. කෙසේ වෙතත් මෙම ආර්ථික ප්‍රතිපත්තිවලට මෙන්ම වර්ධනය වූ සමාජ පන්තියට මෙතෙක් පැවති පැරණි සමාජ ක්‍රමය පූර්ණ වෙනසකට භාජනය කිරීමට නොහැකි විය. කෙසේ හෝ නව සමාජ ප්‍රතිසංස්කරණ යටතේ වැදගත් කරුණක් වන්නේ අධ්‍යාපන අංශයේ සැලකිය යුතු වෙනසක් ඇති වීම ය. එනම් අධ්‍යාපන ක්‍රමය දියුණු වී ස්වභාෂා අධ්‍යාපනය ව්‍යාප්ත වීම ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අධ්‍යාපන අවස්ථා පුළුල් විය. 1959 වන විට සරසවි අධ්‍යාපනය පුළුල්වීමක් දක්නට ලැබේ. එසේ ම සමාජ ප්‍රභේදයන් මෙන් ම දැනුම බෙදන මාධ්‍යවල ද වර්ධනයක් දැකිය හැකි ය.

මෙහි තවත් පැතිකඩක් වනුයේ මෙකී ප්‍රතිසංස්කරණවලින් සමාජීය පරිවර්තනයක් ඇතිවුව ද ඊට සාපේක්ෂ ව ආර්ථික වර්ධනයක් සිදු නොවීම ය. දේශපාලනික අතින් ද එසේ ම ය. දේශපාලනික අතින් ගත් විට ගතානුගතික බවින් ඈත් ව රැඩිකල් දේශපාලනයකට සම්බන්ධ වීමට උත්සාහවත් වීමේ අවශ්‍යතාවක් මේ වන විට වර්ධනය වෙමින් පැවතුණි. දේශපාලන බලය සම්බන්ධයෙන් ගත් විට 1956 වන විට බලය හිමිවූයේ ඉංග්‍රීසි උගත් බටහිර සංස්කෘතිය ගරුකොටගත් ස්වදේශීන් පිරිසකට ය. එහෙත් 1956 එකී දේශපාලන ක්‍රමය වෙනස් වී ආණ්ඩුව හා ජනතාව අතර සම්බන්ධයෙන් ඇති කොටගත් දේශපාලන රටාවකට අවතීර්ණ වනු දැකිය හැකි ය. මෙලෙස දේශපාලන ක්‍රමය ප්‍රගතිශීලී ව වෙනස් මාවතකට අවතීර්ණ වුව ද ඊට සාපේක්ෂ ව රජයන් දේශපාලන ප්‍රතිසංස්කරණ කිරීමට උනන්දුවක් දැක්වූ බවක් නොපෙනේ. 1972 තෙක් දේශපාලනික වශයෙන් ඇති කරන ලද එක ම වැදගත් ප්‍රතිසංස්කරණය වූයේ සර්වජන ඡන්ද බලය වයස අවුරුදු 21 සිට 18 දක්වා අඩු කිරීම පමණකි. මෙහි දී සැලකිය යුතු කරුණ වනුයේ රටක සමාජ, ආර්ථික වර්ධනයට සාපේක්ෂ ව දේශපාලනය ද වර්ධනය විය යුතු ය යන්න යි. එහෙත් එය ලංකාවේ දී එලෙස ම ක්‍රියාත්මක නොවී ය

## 1980 දශකයේ ශ්‍රී ලංකා දේශපාලනය තුළ ජනතා විමුක්ති පෙරමුණේ ඉස්මතු වීම

1980 දශකය වන විට ලංකාවේ ක්‍රියාත්මක දේශපාලනය තුළ විශේෂයෙන් මැතිවරණ ක්‍රියාවලිය මඟින් මෙරට දේශපාලනඥයින් ජනතාවට අප්‍රමාණ පොරොන්දු දීම පැහැදිලි ලෙස ම දක්නට ඇතැම් අවස්ථාවල එකී පොරොන්දු හුදෙක් බලය ලබා ගැනීමට පිණිස ම වූ උපාය ක්‍රියාමාර්ගයක් විය. 1982 පමණ වන විට මෙකී තත්වය තවත් ඔබ්බට ගොස් මැතිවරණවලින් නීති විරෝධී හොර ඡන්ද දැමීම පරාජිතයින්ට

තාඩන පීඩන එල්ල කිරීම ආදි ක්‍රියාවන් ද එක් විය. 1982 ජනාධිපතිවරණය හා 1982 ජනමත විචාරණය මේ සඳහා නිදසුන් සපයනු ලැබී ය. මෙකී මැතිවරණ මඟින් පෙන්නුම් කරන්නේ මැතිවරණ පැවැත්වීමේ නොදියුණු ස්වභාවය යි. අනෙක් අතට 1982 මැතිවරණවල දී ජනතාවට ඡන්දය දීමට තිබූ අයිතිය පවා අහිමි වූ අවස්ථා දැකිය හැකි ය. එසේම විරුද්ධ මත නොඉවසන වාතාවරණයක් ඇති වීම මෙන්ම පවත්නා රජය විවේචනය කළ අවස්ථාවක ද්‍රෝහීන් ලෙස නම් කිරීමත් නිසා දේශපාලන ක්‍රමය දරුණු පිරිහීමකට ලක් වී පක්ෂ ක්‍රමයක් පැවතීමේ වාතාවරණය ක්‍රමයෙන් තුරන් වෙමින් පැවතිණ. මෙකී තත්වයන් හමුවේ ලංකාවේ තරුණ කොටස් සමාජ ආර්ථික දේශපාලන රටාව පිළිබඳ අතිශයින් කලකිරීමට පත්වූහ. මේ කරුණු අනුව තරුණ නැඟී සිටීම් මූලික ව ම තරුණ අසහනය මත හෝ අපේක්ෂා භංගත්වය නිසා ම ඇතිවූවක් නො ව දේශපාලන ක්‍රමයේ වූ තදබල අඩුපාඩු නිසා ඇති වන්නා වූ ප්‍රවණතාවක් බව පෙනෙයි. මින් අවබෝධ වන අනෙක් කරුණ නම් සමාජ ආර්ථික වර්ධනයට සාපේක්ෂ ව දේශපාලන වර්ධනයක් ඇති නොවීම අරගලයට හේතු වූ බව ය.

මීට පෙර අප විසින් කතා කරන ලද අවවර්ධිත දේශපාලන රටාව මැනවින් ග්‍රහණය කරගෙන තරුණයන් අතරට යෑමට ජනතා විමුක්ති පෙරමුණට හැකි විය. ජනතා විමුක්ති පෙරමුණ තරුණයන් තුළ වූ සුවිශේෂී ගුණාංගයක් වන ඉක්මන්කාරී බව හා නිසි පරිදි ගැඹුරින් කරුණු විග්‍රහ කිරීමෙන් වියුක්තව හැඟීම්බර ව ක්ෂණික ව සංවිධානගත වීමේ ලක්ෂණය හොඳින් හඳුනා ගනු ලැබී ය. තරුණයන් දේශපාලනයට සම්බන්ධ කර ගැනිම සිය ඉදිරි දේශපාලන දර්ශනය සාර්ථක කරගත හැකි බව වටහගත් ජනතා විමුක්ති පෙරමුණ සිය ප්‍රතිපත්ති හරහා කේන්ද්‍රීය අවධානය තරුණයන් වෙත යොමු කරමින් සිය දේශපාලන පිළිවෙත සකස්කර ගත්තේ ය. ඒ අතින් බලන විට ඒ වන වට පැවති අනෙකුත් වාමාංශික පක්ෂ හා දක්ෂිණාංශික පක්ෂවලට වඩා තරුණයන් දේශපාලනික වශයෙන් ආකර්ශනය කර ගැනීමේ හැකියාව ජනතා විමුක්ති පෙරමුණට තිබුණි. තම හැඟීම් ආකල්ප නියෝජනය කිරීම හේතු කොට ගෙන තරුණයන් අතර ජනතා විමුක්ති පෙරමුණ ජනප්‍රිය විය (Gunarathna, 1990: 162).

මීට අමතර ව ජ. වි. පෙ. තුළ විද්‍යමාන වූ ඇතැම් ලක්ෂණ කෙරෙහි ද තරුණයන්ගේ පැහැදීමක් පැවතුණි. ජ. වි. පෙ. ප්‍රතිපත්තියක් වශයෙන් තරුණයන් දේශපාලනයට සම්බන්ධ කරගත යුතු බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන ලදී. 1980 මොරටුවේ පැවති රැලියකය දී ජ. වි. පෙ. නායක රෝහණ විජේවීර දැක්වූ අදහස් මෙහිලා වැදගත් වේ. " පනස් හය පැනපු අය විශ්‍රාම ගන්නවා. පනස් හය පැනපු C.T.B රියදුරන් පවා පැන්ෂන් ගන්නේ සේවයට නො ගැලපෙන නිස යි. අන්න ඒ වගේ අපේ වයසක දේශපාලඥයින් පැන්ෂන් ගොස් ආණ්ඩු බලය තරුණ පරම්පරාවට භාරදිය යුතුයි. පසුගිය වසර 33 ක් තිස්සේ රට පාලනය කළ එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට රට වැටී ඇති ප්‍රපාතයෙන් ගොඩ ගැනීමට නොහැකි වී ඇත. රට වැටී ඇති ප්‍රපාතයෙන් ගොඩ ගැනීමට හැකිවනු ඇත්තේ ජනතා විමුක්ති පෙරමුණට යි. රට වැටී ඇති ප්‍රපාතයෙන් ගොඩගැනීමට ජනතා විමුක්ති පෙරමුණ වටා ඒකරාශී වන්නැයි තරුණ පරම්පරාවට හා ජනතාවට ආයාචනය කරමි " (රාවය, 1992 අප්‍රේල් 26).

මෙකී ආයාචනය තරුණයන්ගේ ආකර්ශනයට හා පැහැදීමට හේතු වී ය. අනෙක් අතින් ජ. වි. පෙ. තම පක්ෂයට මේ වනවිට සාමාජිකයන් බඳවා ගැනීමට උපයෝගී කරගනු ලැබූ ක්‍රමවේදය ද තරුණයන්ගේ ආකර්ශනයට හේතු වී ය. මෙහි දී පන්ති පහ ක්‍රමය වැදගත් ය. විශේෂයෙන් 1983 දී ජ. වි. පෙ. පක්ෂ තහනමෙන් පසු පක්ෂයට සාමාජිකයන් බඳවා ගැනීමට අනුගමනය කළ 'ආවෘත පක්ෂයක් (carder party) අනුගමනය කරන වැඩ පිළිවෙළ තරුණයන්ගේ ආකර්ශනයට හේතුවිය. එහි දී රහස් වැඩ පිළිවෙළක් ලෙස පන්ති පහ සහ කඳවුරු පැවැත්වීම මඟින් තම පක්ෂයට සාමාජිකයින් තෝරා ගැනීම සිදු කරන ලදි. මේ සියල්ල රහස් සාකච්ඡා වශයෙන් පැවැත්වුණි. මීට අමතර ව ජ. වි. පෙ. සාමාජිකත්වය ගැනීමට පෙළගැස්වීමක් ද පක්ෂය තුළ පැවතුණි. එහි දී සාමාජිකයන් අපේක්ෂිත සාමාජිකත්වය, අර්ධකාලීන සාමාජිකත්වය හා පූර්ණකාලීන සාමාජිකත්වය වශයෙන් පෙළ ගස්වා තිබුණි. මෙවන් ක්‍රියා මාර්ග හරහා තරුණයාට පක්ෂය පිළිබඳ ව කුතුහලයක් දැනවුණු අතර එමඟින් ඔවුන් පක්ෂයට සම්බන්ධ කර ගැනීමට ජ. වි. පෙ. ට හැකි විය.

එසේ ම වාමාංශික පක්ෂ හා ජ. වි. පෙ. අතර පැවති වෙනස්කම් තරුණයන් මනා ව ග්‍රහණය කරගන්නා ලදි. තරුණ කොටස් පාර්ලිමේන්තු ක්‍රමය දුටුවේ වම දකුණ භේදයකින් තොර ව වරප්‍රසාද හිමි පන්තියක අධිපතිත්වය පවත්වා ගැනීම සඳහා අටවා ගත් උපක්‍රමයක් වශයෙනි. මෙවැනි පාර්ලිමේන්තුවාදය මඟින් සංශෝධන ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වූ සම්ප්‍රදායික වාමාංශිකයන් කෙරේ තරුණයන් බැලුවේ පිළිකුලෙන් මෙන් ම පවතින ධනේශ්වර ක්‍රමයේ ම අලංකාර ආභරණයක් වශයෙනි, (දිවයින, 1986 අප්‍රේල් 16 ). මේ කරුණු මත ඔවුන් ජ. වි. පෙ. වටා සිය අරමුණු ඉටුකර ගැනීම සඳහා ඒකරාශී වනු දැකිය හැකි ය.

## ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවේශය

මෙකී පහසුකම් යටතේ 1971 න් පසු 1990 දක්වා තරුණ නැඟිසිටීම් පිළිබඳ අධ්‍යයනය කරන විට ජ. වි. පෙ. හා තරුණයන් වශයෙන් වියුක්ත ව කරුණු කතා කළ නොහැක. මෙරට තරුණ නැඟීසිටීම ලෙස අර්ථ දැක්විය හැක්කේ ජ. වි. පෙ. නැඟිසිටීම ය. ඒ බව 1971 අරගලයේ දී තහවුරු වන කාරණයකි. 1971 අරගලයෙන් පසු අත්අඩංගුවට ගත් සැකකරුවන් 10,192 පිළිබඳ සංඛ්‍යා ලේඛනවලින් ඔප්පු වූයේ මින් 92. 8% වයස අවුරුදු 16 ත් 32 ත් අතර සිංහල, බෞද්ධ, ගැමි තරුණයන් බව ය. එසේ ම ඔවුන් අතරින් 77% ක් ම වයස අවුරුදු 17 ත් 26 ත් අතර තරුණයන් ය. කැරලිකරුවාගේ සාමාන්‍ය වයස අවුරුදු 20කි (අලස්, 1978: 217). එසේ ම 1988 -1989 අරගලයට සම්බන්ධ වූවන්ගෙන් ද බහුතරය තරුණයන් ය. 1977-1990 ජ. වි. පෙ. ප්‍රචණ්ඩ කැරැල්ලේ දී අත්අඩංගුවට ගෙන තරුණ පුනරුත්ථාපනයට යවන ලද කැරලිකරුවන් පිළිබඳ පරීක්ෂා කරන විට ඒ බව පැහැදිලි වෙයි. ඒ අනුව 1977-1990 අතර කාලය තුළ ජ. වි. පෙ. සම්බන්ධ ව පුනරුත්ථාපනය කළ කැරලිකරුවන් අතරින් තරුණ වයස් කාණ්ඩය වන 1-35 දක්වා කාලයට අයත් තරුණයන් ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් 86.4% කි. ඒ අතරට වයස අවුරුදු 15-25 අතර 47% ක් ද වයස අවුරුදු 30-35 අතර 25.5% ක් වශයෙන් පවතී. එසේ ම මෙම පිරිසට වයස අවු. 15 ට අඩු පිරිස ද

සම්බන්ධ වී ඇත. මොවුන් අතරින් පාසල් සිසුන් බහුතරයක් විය. (පුනරුත්ථාපනය කළ තරුණයන්ගේ තොරතුරු, 1990) මේ නිසා 1971 න් පසු 1990 දක්වා තරුණ නැගී සිටීම් සම්බන්ධයෙන් මෙන් ම 1988 - 1989 අරගලයට හේතු සෙවීමේ දී ද යථෝක්ත පසුබිම අප විසින් සැලකිල්ලට ගත යුතු ය.

1988 - 1989 අරගලවලට හේතු අධ්‍යයනය කරන විට එකී කාලවකවානුව ප්‍රධාන අවධි තුනක් යටතේ සාකච්ඡා කළ හැකි ය.

01. 1971 න් පසු 1982 දක්වා ක්‍රියාකාරීත්වය
02. 1983 න් පසු 1987 දක්වා ක්‍රියාකාරීත්වය
03. 1987 න් පසු ක්‍රියාකාරීත්වය

1971 අරගල අසාර්ථක වීමෙන් පසුව මෙරට තරුණයන් සන්නද්ධ ක්‍රියා මාර්ගයෙන් ඈත් වීමක් දැකිය හැකි ය. විශේෂයෙන් 1971 අරගලයෙන් පසුව ජ. වි. පෙ. ඉහළ නායකයන් බොහෝ දෙනෙකු සිරගත වූ අතර තවදුරටත් සංවිධානය වීමේ හැකියාව ද දුෂ්කර තත්වයක පැවතුණි. ඔවුන්ගේ සංවිධාන ශක්තිය යළි වර්ධනය වන්නේ 1977 න් පසුව ය. 1977 බලයට පත් එක්සත් ජාතික පක්ෂය 1977 අපරාධ යුක්ති විනිශ්චය කොමිසන් සභාව අහෝසිකර 1977 නොවැම්බර් මස 02 වන දින රෝහණ විජේවීර ඇතුළු ජ. වි. පෙ. ඉහළ නායකයන් නිදහස් කරන ලදී. මෙකී නිදහස් කිරීම පිටුපස පරමාර්ථයන් දෙකක් වූ බව පෙනෙයි. එකක් නම් හදිසි නීතිය යටතේ විදේශ විනිමය වංචාකළ එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ ජේ. ආර්. ජයවර්ධනගේ හිතවතුන් පිරිසක් හිරෙන් නිදහස් කිරීමට ය. අනෙක් පරමාර්ථය වූයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නැවත හිස ඔසවමින් පැවති නිසා එයට විරුද්ධව බලවේගයක් ලෙස ජ. වි. පෙ. යොදාගැනීම ය (අරගල (1971 -1988 ,1989) පිළිබඳ ස්වයං විවේචන සහ මාක්ස්වාදය දෙස ආපසු හැරී බැලීමක්, 1988: 24).

කෙසේ වෙතත් 1977 න් පසුව ජ. වි. පෙ. පැහැදිලි ව සන්නද්ධ අරගලයෙන් ඉවත් වී ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයට අවතීර්ණ වනු දැකිය හැකි ය. 1977 මාර්තු 8 වන දින පුවත් පත් සාකච්ඡාවක් කැඳවා ජ. වි. පෙ. ලේකම් උපතිස්ස ගමනායක කියා සිටියේ තම පක්ෂය ඉදිරියේ දී සන්නද්ධ මාවතින් බැහැරව සමාජවාදය ගොඩනැගීමට පාර්ලිමේන්තු ක්‍රමය අනුගමනය කරන බව යි. එසේම ජ. වි. පෙ. යනු මාක්ස් ලෙනින්වාදී පක්ෂයක් බවත් ධනපති ආණ්ඩුව පෙරළා දමා ගොවි කම්කරු ආණ්ඩුවක් ගොඩනැංවීමට කටයුතු කරන බවත් පැවසීය. (Gunarathna, 1990: 54) ඒ වගේ ම සිය පක්ෂයේ ගමන් මාර්ගය පිළිබඳ ව රෝහන විජේවීර 1977 වර්ෂයේ මැද භාගයේ අලව්ව නගරයේ ප්‍රචාරක රැළියක දී මෙසේ ප්‍රකාශ කළේ ය.

"කලින් සිටි මාක්ස්වාදීන් තම දේශපාලන කරත්තය දැක්කුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ තාරකාව බලාගෙන යි. එහෙත් ජනතා විමුක්ති පෙරමුණ කිසිම දිනක ධනපති පක්ෂ සමඟ හවුල් වීමට යන්නේ නොමැත. නව වාමාංශය වූ ජනතා විමුක්ති පෙරමුණේ වර්තමාන උත්සාහය වන්නේ අධිරාජ්‍යවාදී ධනපති පන්ති පාලනය පෙරළා දමා නිර්ධන පංති සමාජවාදී පාලන ක්‍රමයක් බිහි කිරීමයි, (රාවය, 1992: මාර්තු 22).

මෙකී ප්‍රකාශනයන් කෙරෙන් ජ. වි .පෙ. ගමන් මාර්ගය පිළිබඳ අවබෝධ කරගත හැකි ය. 1977 මාර්තු 11 දින පැවති රැළියක දී ද ස්වකීය ඉදිරි වැඩ පිළිවෙල පිළිබඳ පැහැදිලි කළ ජ. වි .පෙ. කියා සිටියේ තම පක්ෂය සන්නද්ධ මාවතින් බලය ලබා ගැනීමේ පිළිවෙතින් බැහැර ව පාර්ලිමේන්තු අරගලයට පිවිසෙන බවත් තමන් තව දුරටත් රහසිගත මිනිසුන් හෝ සංවිධානයක් නොවන බවත් ය (දිසානායක සහ වෙනත් අය, 1993: 31).

1977 න් පසුව වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන් ද තමන් තව දුරටත් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය අනුගමනය කරන බවට ප්‍රායෝගික ව පෙන්වීමට ද උත්සාහ ගත් බව ද පෙනේ. 1977 පටන් 1983 දක්වා පැවැත්වූ සියලු මැතිවරණ සඳහා ජ. වි .පෙ. ප්‍රජාතන්ත්‍රවාදී ව ඉදිරිපත් විය. ඉදිරිපත් වූවා පමණක් නොව ඇතැම් මැතිවරණවලින් සැලකිය යුතු ජයග්‍රහන කිහිපයක් ද ලබා ගත් බව පෙනේ. ඒවා කෙටියෙන් මෙසේ දැක්විය හැකි ය.

01. 1977 මහ මැතිවරණයේ දී හක්මණ, බටහිර අනුරාධපුරය, හොරොව්පතාන-තංගල්ල යන ආසන 04 කට ස්වාධීන කණ්ඩායමක් වශයෙන් තරඟ කර ඡන්ද 3371 ලබා ගැනීම.

02. 1979 ආණමඩුව ආසනය සඳහා පැවති අතුරු මැතිවරනයට ජ. වි. පෙ. අපේක්ෂකයින් ඉදිරිපත් කිරීම.

03. 1981 සංවර්ධන සභා මැතිවරණයේ දී දිස්ත්‍රික් 08 කට තරඟ වැදී දිස්ත්‍රික්ක 08න් ම ඡන්ද 3,27149 ක් හා මන්ත්‍රීන් 11 ක් දිස්ත්‍රික් සංවර්ධන සභාවට තේරී පත් වීම.

04. 1982 ජනාධිපතිවරණයට රෝහණ විජේවීර ජනාධිපති අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත් වී ඡන්ද 273428 ක් (4.19%) ලබා වමේ පළමු වෙනියා මෙන්ම සමස්ත ජනාධිපතිවරණයේ තුන්වන තැනට පත්වීම.

මින් පැහැදිලි වන කාරණය නම් ජ. වි .පෙ. ප්‍රජාතන්ත්‍රවාදී මාවතේ ගමන් කරමින් මේ කාලයේ ජයග්‍රහණ අත්පත් කර ගත් බව ය. මේ මැතිවරණවල මීලඟ මැතිවරණය 1983 පැවැත්වීමට තිබූ මහ මැතිවරණය යි. මෙතෙක් ආ මාර්ගයේ ලැබූ ජයග්‍රහණ හේතුවෙන් මෙම මැතිවරණයේ දී ද තම නියෝජිතයින් ඉදිරිපත් කර ඔවුන්ගෙන් පාර්ලිමේන්තුවට කිහිපදෙනකු යැවීමට අදහස් කරන ලදී. එයින් ජ. වි .පෙ. තවදුරටත් ඉදිරියට ප්‍රජාතන්ත්‍රවාදී මාවතේ ම යාමට අපේක්ෂා කළ බව පෙනෙයි. එහෙත් එක්සත් ජාතික පක්ෂය එකී මහ මැතිවරණය නොපවත්වා හයෙන් පහක බලයක් සහිත පාර්ලිමේන්තුව වසර හයකින් දීර්ඝ කිරීමට ජනමත විචාරණයක් පවත්වන ලදී. මෙය ජ.වි.පෙ පෙර සඳහන් බලාපොරොත්තු හා අවශ්‍යතා මුළුමනින් ම සුන් වීමට හේතු විය. මෙහි දී ජ. වි .පෙ. රජයෙන් 1982 පැවැත්වීමට තිබූ ජනමත විචාරණය නොපවත්වා නියමිත පාර්ලිමේන්තු මැතිවරණය පවත්වන ලෙස ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටින ලදී (Dissanayaka,1994: 23-24). එහෙත් මෙකී ඉල්ලීමට අවනත නොවූ

එක්සත් ජාතික පක්ෂ රජය ජනමත විචාරණය තම අභිමත අන්දමින් පවත්වා ජයග්‍රහණය කරන ලදි. පසුව ජනමත විචාරණය දූෂිත එකක් ලෙස තීන්දු කරන ලෙසත් ඒ සඳහා වන්දියක් වශයෙන් රු. 5000 ක මුදලක් ඉල්ලා රෝහණ විජේවීර අධිකරණයට ගිය ද එකී උත්සාහය ද අසාර්ථක විය (රාවය 1992 : ජුනි 14) තම පක්ෂයට ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය උපයෝගී කරගෙන ලබා ගත හැකි ව තිබූ ජයග්‍රහණ අහිමිකිරීම ඔවුන් තුළ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය කෙරෙහි කළකිරීමක් ඇති කිරීමට හේතු විය. මෙකී තත්වය ඔවුන් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය විශ්වාස නොකර වෙනත් මාර්ගයකට ඇද දැමීමට හේතුවක් විය.

## ජනතා විමුක්ති පෙරමුණ තහනමට ලක්වීම හා ප්‍රජාතන්ත්‍රවාදයෙන් බැහැරවීම

1982 දෙසැම්බර් ජනමත විචාරණයෙන් පසු 1983 වර්ෂයේ පටන් මෙරට දේශපාලනය තුළ තවත් අර්බුදකාරී තත්වයක් නිර්මාණය වෙමින් පැවතුණි. ඒ උතුරේ තරුණයන් කරන ලද සන්නද්ධ අරගලය යි. එකී අරගලය ක්‍රමයෙන් උච්ච අවස්ථාවට පත් වූ අතර මේ කාලයේ ඔවුන් ත්‍රස්තවාදී ස්වරූපයකට ක්‍රමයෙන් ගමන් කරමින් සිටියේය. අනෙක් අතින් මෙය ක්‍රමයෙන් දේශපාලන අර්බුදයක් බවට ද පත් වූ අතර එහි ප්‍රබලතම සිදුවීම 1983 සිදු විය. ඒ 1983 කළු ජූලිය යි. 1983 කළු ජූලියෙන් පසු එකී සිදුවීම් මාලාවට සම්බන් බව පවසා ජ. වි. පෙ. ඇතුළු වාමාංශික පක්ෂ තුනක් 1983 ජූලි මස 29 දින නිකුත් වූ රජයේ විශේෂ ගැසට් නිවේදනයක් මගින් තහනම් කරන ලදී. එහි දී ජ. වි. පෙ. ට අමතර ව ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය හා නව ලංකා සම සමාජ පක්ෂය තහනමට ලක් විය. පසුව කොමියුනිස්ට් පක්ෂයේ හා නව ලංකා සම සමාජ පක්ෂයේ තහනම ඉවත් කළ ද ජ.වි.පෙ තහනම තව දුරටත් පවත්වා ගෙන යන ලදී. තහනමෙන් පසුව ද ජ. වි. පෙ. තම පක්ෂයට තව දුරටත් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහයේ සිටීමට අවශ්‍ය බව පවසා ජ.වි.පෙ තහනම ඉවත් කරණ ලෙස ඉල්ලා ජනාධිපතිවරයාට ලිපියක් මගින් ඉල්ලීමක් කරනු ලැබී ය. ජ.වි.පෙ නායක රෝහණ විජේවීර ජනාධිපතිවරයාට යවන ලද එම ලිපියේ අවසානයේ මෙසේ සඳහන් කර ඇත.

"ජ.වි.පෙ. තහනම ඉවත් කිරීම ජාතික සමගියට සහ සංහිඳියාවට ඇති එකම මාර්ගය මෙය යි. ප්‍රජාතන්ත්‍රවාදයට සහ සාධාරණත්වයට ඇති එක ම මාර්ගය මෙයයි (This is the only way to national conciliation and harmony. This is the only way to development and progress. This is the only way to democracy and justice) වශයෙනි (Gunarathna ,1990: 196).

මෙකී ප්‍රකාශය වැදගත් වන්නේ මින් ගම්‍ය වන වෙනත් කරුණක් පැවතීම නිසාය ය. එනම් තමන්ගේ පක්ෂ තහනම තව දුරටත් රඳවා නොගෙන ඉවත් කිරීම අනාගතය යහපත් වීමට හේතුවක් මෙන්ම තහනම රඳවා ගැනීම අනාගතයේ සාමය, ප්‍රජාතන්ත්‍රවාදය, අහිමිවීමට හේතු වන බව ඉඟි කොට තිබීම යි. සන්නද්ධ අරගලයක්

කළ රැඩිකල් පක්ෂයක් මෙසේ දේශපාලනය තුළ තව දුරටත් රැඳී සිටීමට ඉල්ලූ අවස්ථාව සැලකිල්ලට නොගැනීමේ ප්‍රතිවිපාකවලට 1988 - 1989 කාල වකවානුවේ එ.ජා.ප. රජයට මෙන් ම මුළු මහත් ජනතාවට ම මුහුණ දීමට සිදුවිය.

1988-1989 අරගලයේ ප්‍රධාන හේතුකාරක බීජ රෝපණය කරනු ලැබුවේ මෙකී ජ.වි.පෙ. තහනම දිගින් දිගට පවත්වාගෙන යාම ය. මෙහි දී තම උත්සාහයන් අසාර්ථක වූ තැන ඔවුන් තව දුරටත් ප්‍රජාතන්ත්‍රවාදී මාවතේ රැඳී නොසිටිය හ. තම අරමුණු ඉටු කර ගැනීමට විකල්ප මාර්ග කෙරෙහි අවධානය යොමු කරන්නට විය. රජය පැත්තෙන් ගත් විට මෙකී තහනම ඉවත්කර මේ තරුණයන් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයට ගැනීමට අවස්ථාව තිබුණ ද රජය එසේ නොකිරීම ගැටළුවක් විය. මේ සම්බන්ධයෙන් හේතු සොයා බලන විට විවිධ උගතුන්ගේ විවිධ අදහස් ඉදිරිපත් වී තිබේ.

ජ.වි.පෙ. තහනම් කිරීමට ආසන්න ම හේතුව වශයෙන් රජය දක්වනු ලැබුවේ 1983 කළු ජූලිය සිදු වීමේ දී ජ.වි.පෙ. ඊට සම්බන්ධ වී කුමන්ත්‍රණකාරී අයුරින් රාජ්‍ය බලය ලබා ගැනීමට උත්සාහ කිරීම යි. එහෙත් මෙකී තහනමට මෙම කරුණු ම හේතුවූවා ද නැතහොත් ඊට අමතර කරුණු බලපාන්නට ඇති ද යන්න අපැහැදිලි ය. එහි දී ජ.වි.පෙ. 1983 මැයි 01 සැමරූ ජාත්‍යන්තර කම්කරු දිනය වැදගත් අවස්ථාවකි. ජාත්‍යන්තර කම්කරු දිනය ජ.වි.පෙ. අති උත්කර්ෂවත් අන්දමින් සමරනු ලැබීය. ජ.වි.පෙ. මැයි රැළිය අනිකුත් පෙළපාලිවලට වඩා වෙනස් ස්වරූපයක් ගත්තා ලදී. තරුණයන්ගෙන් සමන්විත යුධ පෙළපාලියක ස්වරූපයකට සමාන විය. එය එ.ජා.ප. රජයට ත්‍රාසය භීතිය ගෙන දෙන්නක් විය. අනෙක් කරුණ වූයේ එකී මැයි දින රැළියේ දී ජ.වි.පෙ. නායකයන් ජනතාව අමතමින් කිවේ මේ වර්ෂය අවසානයට පෙර ශ්‍රී ලංකාවේ රාජ්‍ය බලය අත්පත් කර ගන්නා බව යි (ලංකාදීප, 1991 ජූනි 28). මෙකී තත්ත්වය රජය විසින් උපයෝගී කරගන්නට ඇත.

අනෙක් අතට 1982 ජනමත විචාරණය අභියෝගයට ලක් කර අධිකරණයට ගියේ ද ජ.වි.පෙ. ය. මෙය එ.ජා.ප.යට කළ අභියෝගයක් බඳු විය. එසේ ම අනෙක් අතින් වසර 5 ක ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ගමනකින් ඔවුන් බලවත් දේශපාලන පක්ෂයක් බවට පත් වී වැඩි කල් නොගොස් රජයට තර්ජනයක් වනු ඇතැයි ඉහළ පෙළේ ආධාරකරුවන් ජනාධිපතිවරයාට ඒත්තු ගැන්වීම තවත් හේතුවක් වන්නට ඇත (රාවය, 1992 ජූනි 28).

1983 ජ.වි.පෙ. තහනම පිළිබඳ ව විවිධ උගතුන් විවිධ ආකාරයෙන් කරුණු දක්වා ඇත. මේ සම්බන්ධයෙන් බොහෝ කරුණු ප්‍රමාණයක් රොහාන් ගුණරත්නගේ Sri Lanka : A lost Revolution (1990) ග්‍රන්ථයේ සඳහන් වේ. එහි දී කතුවරයා ජ.වි.පෙ. තහනමට බලපාන හේතු තුනක් දක්වා ඇති අතර ඉන් දෙකක් වෙනත් හේතු වශයෙන් ද එකක් කතුවරයා පෙන්වන හේතු වශයෙන් පෙන්වා දිය හැකි ය. ඒවා නම්

01. බොහෝ අය කියන්නේ ජනතා විමුක්ති පෙරමුණ ජූලි කලබලයට සහභාගී වීම නිසා පක්ෂය තහනම් කිරිමට ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන තීරණය කළ බව.

02. නියෝජ්‍ය පොලිස්පති අර්නස්ට් පෙරේරා ජේ.ආර්. ජයවර්ධනට දුන් රහස් වාර්තාව ජනතා විමුක්ති පෙරමුණ තහනම් කිරීමට හේතු වූ බව.

03. ගතවූ පස් අවුරුදු කාලය තුළ ජනතා විමුක්ති පෙරමුණ ඉතාමත් බලවත් පක්ෂයක් ලෙස රජයට පෙනෙන්නට වීම.

මෙහි දී ඔහු සඳහන් කරන්නේ ජ.වි.පෙ. තහනම රජයේ අවශ්‍යතාවක් මත සිදු වූවක් මිස ජූලි ප්‍රචණ්ඩ ක්‍රියාවලට සම්බන්ධ වූයේ යැයි කියන නිසා ම සිදු වූවක් නොවන බවයි (Gunarathna, 1990 : 202).

1983 පක්ෂ තහනමෙන් පසු එකි තහනම ඉවත් කර ගැනීමට තමන්ට ආධාර කරන ලෙස ජ.වි.පෙ විවිධ ජාත්‍යන්තර සංවිධානවලින් ඉල්ලා සිටි අතර එහි දී නීතිඥයන්ගේ සංවිධානය, ආසියාවේ නීති සංගමය, සිඩ්නි නුවර බටහිර පැසිපික් නීති සංගමය ආධාර කිරීමට ඉදිරිපත් විය. මේ අනුව 1983 අගෝස්තු 25 දින මෙරට පැට්‍රිෂියා හින්ඩ්මන් (Patricia Hyandman) සහ සයිමන්ඩීන් ෂවුන්ඩ් (Samuidia Shound) ගේ ප්‍රධානත්වයෙන් මානව හිමිකම් සංවිධානයේ කමිටු කණ්ඩායමක් ලංකාවට පැමිණියහ. 1983 සැප්තැම්බර් 01 දක්වා මෙරට සිටි ඔවුන්ගේ ප්‍රධාන අරමුණ වූයේ;

1. 1983 ජූලි ප්‍රචණ්ඩත්වය ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය ගැන සොයා බැලීම
2. හදිසි නීතිය ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කරනු ලබන යුක්ති සහගත බව
3. හදිසි නීතිය යටතේ රජයේ බලධාරීන් සහ දේශපාලන බලධාරීන්ගේ ප්‍රතික්‍රියාවන්
4. හමුදා පරිපාලන අංශයේ ක්‍රියාකාරිත්වය කුමන ආකාරයෙන් ක්‍රියාත්මක වන්නේ දයන්න සොයා බැලීම ය (ගුණසේකර 2000 : 9899 ).

එහි දී පැමිණි කමිටු සමාජික හා ඔස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර නිව් සවුත් වේල්ස් සරසවියේ (University of New South Wales) පැට්‍රිෂියා හයින්ඩ්මන් විසින් මානුෂික අයිතිවාසිකම් පිළිබඳ කොමිසමට (Human Rights Standing Committee) 1985 ලියන ලද වාර්තාවක ජ.වි.පෙ. තහනම සම්බන්ධයෙන් ජ.වි.පෙ. වර්ධනය රජයේ ස්ථාවරයට බලවත් තර්ජනයක් එල්ල වී ඇති බව 1985 පෙබරවාරි ඔහු කථා කළ බොහෝ දෙනා පැවසූ බවත් තහනමට පෙර ජ.වි.පෙ. විශාල බලවේගයක් ව නැගී ආ බවත්, ශිෂ්‍යයන්ගේත් තරුණ ඡන්ද දායකයන්ගෙන් සිත් ඇද බැඳ ගත් බවත් එය ලබා ඇති චෝදනාවට වඩා මෙය බලගතු බවත් රජයේ තහනම දිගට ම ගෙන යාමට එය හේතු වූ බවත් සඳහන් කර ඇත (Gunarathna, 1990: 199). මේ අනුව අපට පැහැදිලි වන්නේ 1983 ජ.වි.පෙ. පක්ෂ තහනම හා එකී පක්ෂ තහනම දිගින් දිගට පවත්වාගෙන යාමට 1983 කළු ජූලි සිදු වීම ම හේතු නොවූ බව සඳහන් ය.

## 1988-1989 තරුණ අරගලවලට බලපෑ හේතු

මේ අනුව මෙතෙක් දක්වන ලද කරුණු කෙසේ වුවත් අවසානයේ සිදුවූයේ ජ.වි.පෙ. ප්‍රජාතන්ත්‍රවාදී මාවතෙන් ඉවතට විසි වීම යි. එහි ප්‍රතිඵලයක් ලෙස 1971 අරගලයට වඩා සංවිධානාත්මක විනාශකාරී අරගලයක් වූ 1988 - 1989 අරගලය ඇති වීම ය. ඒ අනුව එකී කැරැල්ල සම්බන්ධයෙන් බලපෑ ප්‍රධාන හේතු කාරණා මෙසේ සංක්ෂිප්ත කළ හැකි ය.

- සමාජ ආර්ථික වශයෙන් තරුණයන් හමුවේ (1971 සිට) පැවති අර්බුද නොවිසඳී එලෙස ම පැවතීම.

- ප්‍රධාන දේශපාලන පක්ෂයන්ට එකී ගැටළු හඳුනා ගෙන ඒවා විසඳීමට වැඩ පිළිවෙළක් හෝ අරමුණක් නොවීම.

- 1982 දක්වා මෙරට ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය කෙරෙහි තරුණයන් තුළ කලකිරීමක් ඇති වීම.

- 1983 පැවැත්වීමට තිබූ මහ මැතිවරණය නොපවත්වා ඒ වෙනුවට රජයේ ආයු කාලය 06 වසරකින් දීර්ඝ කර ගැනීම සඳහා ජනමත විචාරණයක් පැවැත්වීම.

- 1983 කළු ජූලි සිදුවීම උපයෝගී කරගෙන ඇතම් දේශපාලන පක්ෂ තහනම් කිරීම හා ජ.වි.පෙ. තහනම දිගින් දිගට ම පවත්වාගෙන යාම.

- පක්ෂ තහනම ඉවත් කර ගැනීමට දේශීය වශයෙන් හා ජාත්‍යන්තර වශයෙන් ගත් උත්සාහයන් අසාර්ථක වීම.

මෙකී හේතු සාධක අතුරින් ප්‍රබලතම හේතු දෙකකි. ඉන් පළමුවැන්න වනුයේ 1982 ජනමත විචාරණය යි. 1982 ජනමත විචාරණය පාර්ලිමේන්තු දේශපාලනයේ නිෂ්ඵලත්වය පැහැදිලි කරන්නක් විය. පාර්ලිමේන්තු මැතිවරණය පැවැත් වූවානම් ජ.වි.පෙ. ට පාර්ලිමේන්තුව තුළ බලපෑම් කළ හැකි ඡන්ද ප්‍රමාණයක් හා අපේක්ෂක ප්‍රමාණයක් ලබා ගත හැකි වාතාවරණයක් තිබිණි. එකී අරමුණට මෙරට පාලකයන් හරස් කපන ලද බව ජ.වි.පෙ. කල්පනා කරන ලදී. දෙවෙනි කරුණ වූයේ 1983 ජූලි සිදුවීම පදනම් කරගෙන ජ.වි.පෙ. තහනම් කිරීම ය. මෙකී තහනම ඉවත් කර ගැනීමට ගත් උත්සාහය අසාර්ථක වීම ඔවුන් තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදයේ රැඳී සිටීමට නො හැකි තත්වයක් උදා විය. එහෙයින් ඔවුන් තෝරා ගත් විකල්පය වූයේ සන්නද්ධ වීම ය. තත්වය මෙසේ තිබිය දී 1983 ජූලි මාසයෙන් පසු රජය විසින් ජ.වි.පෙ. ට එරෙහිව ප්‍රචණ්ඩත්වය මුදා හරින ලදී. විශේෂයෙන් මේ වන විට විවිධ සංවිධාන හා දේශපාලන පක්ෂ ජ.වි.පෙ. තහනම ඉවත් කර ඔවුන්ට පවතින ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට පැමිණීමට ඉඩ ප්‍රස්තාව සලසන ලෙස ඉල්ලා සිටින ලදී (Senarathna,1987: 111) මෙම ඉල්ලීම්වලට කිසිදු අවධානයක් යොමු නො කළ රජය

ඒ වෙනුවට කරන ලද්දේ ජ.වි.පෙ. නායකයන් හා ප්‍රාදේශීය නායකයන්, දේශපාලන මණ්ඩලයේ නායකයන් අත්අඩංගුවට ගෙන වද හිංසා කිරීමයි (රාවය: 1992 ජුලි 19) මෙසේ අත්අඩංගුවට ගත් ප්‍රමාණය සලකා බලන විට 1983 ජූලි මාසයේ සිට 1983 දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ පමණක් ජ.වි.පෙ. නායකයන් 13 දෙනෙකු අත් අඩංගුවට ගෙන රඳවා ගනු ලැබීය (රාවය 1992 අප්‍රේල් 05) එසේ ම අනෙක් අතින් රාජ්‍ය අනුග්‍රහය සහිතව ජ.වි.පෙ. ට හා එකී නායකත්වයට එරෙහි ව අපහාසාත්මක දැන්වීම්, පෝස්ටර් ආදිය ලංකාව පුරා ප්‍රදර්ශනය කරන ලදී. මින් පැහැදිලි වන්නේ ජ.වි.පෙ. මතවාදය මර්දනය කිරීමට රජය උත්සාහ ගත් බවය. මෙකී ක්‍රියාමාර්ගයන් හමුවේ සිදුවූයේ ජ.වි.පෙ තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයේ රැඳී සිටීමට දැරූ සෑම උත්සාහයක් ම රජය විසින් විනාශ කිරීම ය (Gunarathna, 1990: 19). ඒ නිසා ඔවුහු තවදුරටත් ඒ මාරගයේ ගමන් නොකිරීමට තීරණය කළහ.

පක්ෂ තහනමත් ඉන් පසුව මර්දනකාරී වැඩ පිළිවෙළත් හේතු කොටගෙන ජ.වි.පෙ. ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිළිවෙළින් තවදුරටත් ඈත්කරවීමට හේතු විය. මැතිවරණ නොපැවැත්වීම, මතවාද දැරීමේ අයිතිය අහෝසි කිරීම, මර්දනකාරී ක්‍රියාමාර්ග දියත් කිරීම ආදී කරුණු මත සම්පූර්ණයෙන් ම ජ.වි.පෙ. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයෙන් ඈති වී විප්ලවීය ක්‍රියාමාර්ගයට අවතීර්ණ වීමට බෙහෙවින් ම හේතු කාරකවිය. ඒ අනුව 1984 න් පසුව ජ.වි.පෙ. අවධානය යොමු කරන ලද අංශයන් වූයේ;

(1) විප්ලවීය ක්‍රියාමාර්ගය කෙරෙහි විශ්වාස තබා තම පක්ෂය සංවිධානය කිරීම
(2) යුධමය අංශ ශක්තිමත් ව සංවිධානය කිරීම
(3) යුධමය අදහස් සාමාජිකයන්ගේ මනසට කා වැද්දීම

මේ සියල්ලෙන් ම ක්‍රමානුකූල ව තරුණයන් හා පක්ෂ සාමාජිකයන් අතර මනෝ මූලික සාධක ඇති කරනු ලැබී ය. අනෙක් අතින් සමාජය තුළ පැවති විෂය මූලික සාධක එකතු කිරීමට ද උත්සාහවත් විය. මාක්ස්වාදී අර්ථකථනයට අනුව විප්ලවීය ක්‍රියා මාර්ගයක් සඳහා විෂය මූලික හා මනෝ මූලික කොන්දේසි සම්පූර්ණ විය යුතු ය. ඒ සඳහා අවශ්‍ය විෂය මූලික අවශ්‍යතාවන් තුනක් වේ. එනම්,

(1) පාලක පන්තිය ඔවුන්ගේ පාලනය කිසිදු වෙනසක් නොකර පවත්වා ගෙන යාමට දුෂ්කර වන අතර, ඔවුන් එක් ආකාරයකට හෝ තවත් ආකාරයක අර්බුදයක්, පීඩිත පංතීන්ගේ පුපුරා යාමට ආසන්න ව තිබෙන අසතුට හා කෝපය මගින් බේදීම ඇති කරවන පාලක පන්තියේ ප්‍රතිපත්තිමය අර්බුදයක් විප්ලවීය පැන නැගීමට පහළ පන්තින්ට පමණක් නොව ඉහළ පංතීන් පැරණි ක්‍රමයට ජීවත්වීමට නොහැකි වීමේ තත්වයක් අවශ්‍ය වීම.

(2) පීඩිත පංතීන්ගේ උවමනාවන් සාමාන්‍ය තත්වයට පඩා තියුණු අන්දමින් වර්ධනය වී තිබීම, ඒ නිසා ඔවුන්ට පැරණි ක්‍රමය තුළ තවදුරටත් ජීවත්වීමට නොහැකි තත්වයක් උදා වී තිබීම.

(3) ඉහත සඳහන් හේතුවල ප්‍රතිඵල වශයෙන් ජනතා ක්‍රියාකාරිත්වය සැලකිය යුතු ප්‍රමාණයක් වැඩි වී තිබීම අවශ්‍ය වේ (දිසානායක සහ වෙනත් අය, 1993 : 201202). එසේ ම විප්ලවයක් හටගැනීමට අවශ්‍ය වන්නා වූ මනෝ මූලික සාධකයන් 3 (තුනක් ) ද වෙයි. එනම්,

(1) වැඩ කරන ජනතාව අතර විප්ලවීය පිබිදීම හා මුළු අරගලය විප්ලවයේ අවසානය දක්වා ම ගෙනයාමට එම පංතීන්ගේ ඇති සූදානම සහ අධිෂ්ඨානය ඉහළ තලයකට වර්ධනය වී තිබීම.

(2) විප්ලවයේ සියලු බලවේග ඒකරාශී කරන, වැඩ කරන ජනතාවගේ සංවිධානයක් එනම් අරගලයේ සෑහෙන අත්දැකීම් සහ දැනීමක් ඇති නිවැරදි උපාය මාර්ගයක් යතු උපක්‍රම සංවර්ධනය කිරීමට හැකියාව ඇති ක්‍රියාවට යොදවන, පවතින තත්වය අනුව උචිත ලෙස ක්‍රියා කරන නිවැරදි වැඩ පිළිවෙළක් සහ ක්‍රියා මාර්ගයන් සහිත විප්ලවීය බලවේගයක් තිබීම.

(3) එබඳු සංවිධානයක් පෙරමුණක් මගින් ජනතාවට දෙනු ලබන අධිෂ්ඨාන සහගත නායකත්වය අවශ්‍ය වේ (දිසානායක සහ වෙනත් අය, 1993 : 201,202).

මෙකී මනෝ මූලික සාධක සහ විෂය මූලික සාධක විප්ලවයක දී අත්‍යවශ්‍යයෙන් ම සම්පූර්ණ වී වර්ධනය වී මෝරා යා යුතු ය. එසේ නොවන තැන විප්ලවය අසාර්ථක වනු නියතය. අනෙක් කරුණ මෙකී සාධකයන් සමාජය තුළ උත්තරාරෝපණය කළ නොහැකි වීම ය. මේවා සමාජය කෙරෙන්ම හටගත යුත්තකි. එසේ ම මෙකී සාධක අතලොස්සකට නොව සමස්ත ජනයාට ම බලපාන ආකාරයෙන් විසිර පැවතීම අනිවාර්ය තත්වයකි. මේ පසුබිම යටතේ ජ.වි.පෙ. ක්‍රියාකාරිත්වය දෙස අවධානය යොමු කරන විට පෙනී යන කරුණ නම් ජ.වි.පෙ. විප්ලවීය මාර්ගය තෝරා ගනු ලබන්නේ මෙකී සාධක මෝරායාම හේතු කොටගෙන නොවන බව ය. ඔවුන් පක්ෂ තහනමෙන් පසු ඇති වූ මර්දනයෙන් ගැලවීම උදෙසා රාජ්‍ය බලය කෙසේ හෝ ලබා ගැනීමට විප්ලවයක් කිරීමට උත්සාහ ගැනීමක් සේ පෙනෙයි. ඒ අනුව මෙම විප්ලවය සමාජ අවශ්‍යතාවකට වඩා ජ.වි.පෙ. අවශ්‍යතාවක් වූවා ද යන ගැටළුව පැන නගී. එසේ ම ජ.වි.පෙ. විප්ලවීය තීන්දුව ගන්නා විට මෙරට සමාජය තුළ උක්තව කතා කරන ලද මනෝ මූලික විෂය මූලික සාධක මෝරා ගොස් නොතිබීම ද විශේෂත්වයකි. මේ තත්වය තුළ විප්ලවීය අවශ්‍යතාව උත්තරාරෝපණය කිරීමට ජ.වි.පෙ. ට සිදුවිය. එසේම එකී සාධකයන් සමාජය තුළ බලහත්කාරයෙන් මතු කිරීමට ගත් උත්සාහයක් බව ද පෙනී යන කරුණකි. තත්ත්වය එසේ වුව ද විප්ලවයකට අදාළ වන්නා වූ මනෝ මූලික විෂය මූලික සාධක සමාජය තුළ වර්ධනය වෙමින් පැවතුණ බව නම් කිව යුතු ය. එසේ ම 1971 න් පසු දේශපාලන, ආර්ථික, සමාජීය ක්ෂේත්‍රයන්හි විකාශය දෙස අවධානය යොමු කළ විට පෙනෙන කරුණ නම් පෙරකතාකළ සාධක දළු ලා වැඩෙමින් පැවති බව ය. 1971 පටන් ක්‍රමානුකූල ව වර්ධනය වී 1988 වන විට යම් ප්‍රමාණයක උච්ඡ ස්ථානයක් පැවතුණි. උදා: වශයෙන් තරුණ අසහනය, රැකියා වියුක්තිය, ජීවන වියදම ඉහළ යාම, ආදායම් බෙදීයාමේ විෂමතාව හා දුප්පත්කම ආදී කාරණා මගින් පොදු සාමාන්‍ය ජනයා පීඩාවට පත් වී සිටි බව පෙනෙයි.

මේ පසුබිම තුළ ජ.වි.පෙ. විප්ලවීය මාර්ගයකට අවතීර්ණ විය. එසේ ම සිය දේශපාලන ව්‍යාපාරය ශක්තිමත් ව ගොඩ නගනු ලැබී ය. ඔවුන් රෙජිස් ඩෙබ්රේගේ විප්ලවයේ විප්ලවය (Revolution in Revolution) නම් කෘතියේ සඳහන් විප්ලවය සඳහා කම්කරුවන්, ගොවියන්, ඇතුළු පීඩිත ජනතාව සූදානම් වුවත් නැතත්, සංවිධානාත්මක ගරිල්ලා කණ්ඩායමක් මගින් බලය අල්ලා ගත හැකි නම් විප්ලවය සාර්ථක කර ගත හැකි ය, යන අදහස මත පිහිටා සිය කටයුතු කරන ලදී (දිසානායක සහ වෙනත් අය, 1993: 203).

1984 යළි සංවිධාන කටයුතු ඇරඹූ ජ.වි.පෙ. ක්‍රියාකාරීන් රැසකට වගකීම් පවරන ලදී. මූලික නායකයන් දෙදෙනෙකු යටතේ දේශපාලන මණ්ඩල සාමාජිකයන්ට වගකීම් පවරන ලදී ( දිසානායක සහ වෙනත් අය, 1993: 58) ජ.වි.පෙ. සංවිධාන ව්‍යුහය අනුව පක්ෂයේ ඉහළ ම සංවිධානය සභාපති රෝහණ විජේවීර ය. ඉන්පසුව දෙවනු ව දේශපාලන මණ්ඩලයත්, තෙවනු ව මධ්‍යම කාරක සභාවත් විය. දේශපාලන මණ්ඩලය මෙහෙයවීම යටතේ අංශ කිහිපයකි. භික්ෂු, ශිෂ්‍ය, තරුණ, කම්කරු, කාන්තා වශයෙනි. එසේම දේශපාලන මණ්ඩලය යටතේ ම අනෙක් අතින් අධ්‍යාපන, ප්‍රචාරණ, මුදල්, සංවිධාන, සංස්කෘතික වශයෙන් අංශ කිහිපයක් විය. අනතුරුව දිස්ත්‍රික් කමිටු, මැතිවරණ කොට්ඨාස කමිටු සහ ශාඛා කමිටු වශයෙන් විය (දිසානායක සහ වෙනත් අය, 1993: 275) මෙම සංවිධාන ව්‍යුහය 1987 දක්වා ම ක්‍රියාත්මක විය. මේ අවදියේ එනම් 1983 - 1987 කාලය තුළ රහසේ තම සංවිධාන කටයුතු කරන ලදී. සංවිධාන ව්‍යුහයේ කේන්ද්‍රීය බලවේගය බවට පත් වූයේ ශිෂ්‍ය ව්‍යාපාරය යි (දිසානායක සහ වෙනත් අය 1993: 59).

ජ.වි.පෙ. සක්‍රිය බලවේගයක් වශයෙන් ශිෂ්‍ය ව්‍යාපාරය දකින ලදී. එසේම සටන් කාමී දේශපාලනයට තෝ තැන්නක් වශයෙන් ද දුටුවේ ශිෂ්‍ය ව්‍යාපාරය යි. 1971 අරගලයේ දී ද ශිෂ්‍ය ව්‍යාපාරය ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරන ලදී. එසේම වඩාත් ම බලපෑම් සහගත කණ්ඩායම වූයේ ද ශිෂ්‍ය ව්‍යාපාරය යි. 1971 අරගලය අසාර්ථක වීමෙන් පසු ජ.වි.පෙ. සන්නද්ධ මාවතින් ඉවත්ව ප්‍රජාතන්ත්‍රවාදී මාවතට අවතීර්ණ වීමත් සමග ශිෂ්‍ය ව්‍යාපාරය හරහා ඔවුන් විශ්වවිද්‍යාලයන් කිහිපයක බලය තහවුරු කර ගන්නා ලදී. ජ.වි.පෙ. වටා එක්රැස් වූ අධ්‍යාපන බලවේගයන් අතර උපාධිධාරීහු ප්‍රමුඛ වූහ. 1977 - 1990 ජ.වි.පෙ. ප්‍රචණ්ඩ කැරැල්ලේ දී අත්අඩංගුවට පත් තරුණයන් පුනරුත්ථාපනය කළ අතර ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම විමසීමේ දී මෙකී කාරණය තහවුරු වේ. ඊට අමතර ව බහුතරය අ.පො.ස. (සා.පෙළ) හා පාසලේ වසර 9 - 10 අතර ඉගෙන ගත් තරුණයන් ය. මෙම බලවේගයන් අතරින් සක්‍රියව 1987 - 1989 කැරැල්ල දක්වා බලපෑම් කළ පිරිස වූයේ විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන් ය. ඔවුන් ද ජ.වි.පෙ. වටා එක්රොක් වූයේ ඔවුන්ට ම ආවේණික ගැටළුවලින් පෙළීම නිසා ය. ඒ අනුව මේ වන විට විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන් රාශියකට මුහුණ දෙමින් සිටි අර්බුදයන් අතර;

(1) නිදහස් අධ්‍යාපනය කප්පාදු කිරීම සඳහා රජය විවිධ මාර්ගවලින් උත්සාහ දැරීම.

(2) ශිෂ්‍ය ව්‍යාපාරය රජයේ මර්දනයට ලක්වීම විශේෂයෙන් ශිෂ්‍ය නායකයින් ඝාතනය වීම හා අතුරුදහන් වීම.

(3) විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තරයේ පවතින සුභසාධන නේවාසික පහසුකම් ශිෂ්‍යාධාර ප්‍රමාණවත් නොවීම.

මෙම අර්බුද විශ්වවිද්‍යාලයීය සිසුන් නිරන්තර අරගලකාරී පිරිසක් බවට පත් කිරීමට හේතු වී ඇත 1983 න් පසු මෙකී අරගල වල වැඩිවීමක් දැකිය හැකි ය. 1983 ජූලි සිදුවීමෙන් පසු දේශපාලන පක්ෂ තහනම් කල නීතිය, විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගම්වලට ද බලපානු ලැබීය. ශිෂ්‍ය සංගම් තහනම් වීමෙන් පසු සිසුන් තම අයිතීන් දිනා ගැනීමට " ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටු, පිහිටුවා ගන්නා ලදි. එකී කමිටු හරහා අරගල ඉදිරියට ගෙනයනු ලැබී ය. ඒ සඳහා ජ.වි.පෙ. ද සහාය ලැබුණි. 1983 ශිෂ්‍ය සභා තහනමෙන් පසු රජය ශිෂ්‍ය සංගම් මර්දනය පුළුල්ව සිදුකිරී ම හේතුවෙන් තම අරගල අඩු නොකර දිගටම කර ගෙන යන ලදී. 1986 සැප්තැම්බර් මාසයේදී ජ.වි.පෙ. මැදිහත් වීමෙන් දේශප්‍රේමී ශිෂ්‍ය ව්‍යාපාරය පිහිටුවන ලද අතර එහි වැඩ කටයුතු මෙහෙයවීම සඳහා සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ලේකම් ආනන්ද ඉඩමේගම පත් කරනු ලැබීය (දිසානායක සහ වෙනත් අය, 1993: 65).

## ශ්‍රී ලංකාවේ දෙවන තරුණ නැගීසිටීම

1987 වර්ෂය ලංකාවේ තරුණ නැගී සිටීම් සම්බන්ධයෙන් තීරණාත්මක වසරකි. 1985 දෙසැම්බර් පමණ වන විට දේශප්‍රේමී අරගලය සඳහා පක්ෂය පූර්ණ වශයෙන් ප්‍රතිසංවිධාන කළයුතු බවට පවසා සියලු සංවිධාන ප්‍රතිසංස්කරණ කරන ලදී (දිසානායක සහ වෙනත් අය, 1993: 65). කෙසේ වෙතත් 1986 වන විට සෑම අංශයකින් ම විප්ලවීය පියවරක් තබමින් තම සංවිධාන කටයුතු ඉදිරියට ගෙන යන ලදී. ඒ අනුව 1987 න් පසු ජ.වි.පෙ. සංවිධාන ව්‍යුහය ඉතා පුළුල් ආකාරයෙන් සංවිධානය වූ බව කිව හැකි ය. සංවිධාන ව්‍යුහයේ ඉහළ ම සංවිධානය එහි නායකයා (සභාපති) වූ රෝහණ විජේවීර ය. ඊට අමතරව දේශපාලන මණ්ඩලය; මධ්‍යම කාරක සභාව යන අංශ දෙකකින් යුක්ත විය. ඊට අමතර ව දේශපාලන මණ්ඩලය සෘජු මෙහෙයවීම යටතේ කලාපීය, ක්ෂේත්‍ර, පෙරමුණු වශයෙන් අංශ තුනක් විය. කලාපීය අංශ සඳහා කලාපීය කමිටු ද, ක්ෂේත්‍ර හා පෙරමුණු සඳහා ජාතික කමිටුව ද වශයෙන් ප්‍රධාන කමිටු වර්ග දෙකක් තිබිණ. කලාපීය කමිටුවක් තුළ ද ක්ෂේත්‍ර හා පෙරමුණු අංශ පැවතිණි. ඊට අමතර ව ජාතික කමිටු, දිස්ත්‍රික් කමිටු, ප්‍රාදේශීය කමිටු, ශාඛා කමිටු වශයෙන් කමිටු ද විය (දිසානායක සහ වෙනත් අය, 1993: 81). මේ අතර ජ.වි.පෙ. මතවාදයන් ද වෙනසකට භාජනය විය. 1986 වන විට රටේ බෙදුම්වාදී අර්බුදය ඉතාම වර්ධනීය තත්වයක පැවති අතර එය ද ජ.වි.පෙ. දේශපාලන මතවාදයට ගොදුරු විය. විජේවීර ලියූ දෙමළ ඊලාම් අරගලයට විසඳුම කුමක් ද? කෘතියේ ත්‍රස්තවාදය දැඩි ලෙස ප්‍රතික්ෂේප කරන ලදී. එහි දී හඳුන්වා තිබූ ආකාරයේ ත්‍රස්තවාදය යන්න වැඩි කල් නොගොස් ජ.වි.පෙ. තුළ ද ක්‍රියාත්මක වූ බව පැහැදිලි ය. කෙසේ වෙතත් මේ කාලය වන විට ආණ්ඩුව විසින් ජ.වි.පෙ. මර්දනය කිරීමට මාන බලමින් සිටි අතර එය තහවුරු කරමින් අත්අඩංගුවට ගැනීම් ප්‍රමාණය ද විශාල විය. 1987 ජනවාරි 18 දින බ්‍රිතාන්‍ය ගුවන් විදුලි සංස්ථාව කළ ප්‍රකාශයකට අනුව දකුණේ පමණක් අත්අඩංගුවට ගෙන සිටි සංඛ්‍යාව 3000 කි (දිසානායක සහ වෙනත් අය, 1993: 69). මෙකී තත්ත්වයන් ජ.වි.පෙ. සම්පූර්ණයෙන් ම සන්නද්ධ මාවතට අවතීර්ණ කිරීමට තවත් හේතුවක් විය.

එක් අතකින් පක්ෂය තහනම් කර තමන්ට ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන අවකාශයට ඒමට ඇති අවස්ථාව අහිමි කරමින් ද අනෙක් අතින් තම ව්‍යාපාරය මර්දනය කිරීමට රජය යම් යම් පියවරයන් අරගැනීම ද හේතු කොටගෙන තමන් දැඩි මර්දනයකට ලක් වේ ය යන සිතුවිල්ල ජ.වි.ප. තුළ මෝරන්නට විය. එකී මර්දනයෙන් මිදීමට ඔවුන්ට යම් මාර්ගයකට අවතීර්ණ වීමට සිදුවිය. එහි දී ඔවුන් සන්නද්ධ මාවත තෝරා ගන්නා ලදී. එපමණක් නොව ඒ සඳහා අවශ්‍ය ව්‍යාපාරයක් ද නිර්මාණය කරණ ලදී. ඒ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය යි.

1987 මුල් භාගයේ දී ඇරඹි මෙම ව්‍යාපාරය ජ.වි.පෙ. සන්නද්ධ අංශය විය. දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය යනු ජ.වි.පෙ. සඳහන් කරන ආකාරයට, ශ්‍රී ලංකාවේ ආරක්ෂාව සඳහා ගොඩනැගූ බහුජන සංවිධානයකි, මව්බිමේ ඒකීය භාවය සහ පැවැත්මට තර්ජනයක් එල්ල වී ඇති බවත් ඉන් මුදවා ගැනීම සඳහා ජනතාව විසින් පිහිටුවා ගත් සංවිධානයක් ලෙස ඔවුන් සඳහන් විය (දිසානායක සහ වෙනත් අය, 1993: 70) මෙය ජනතාව විසින් ගොඩ නැගුව ද පසු කල ජ.වි.පෙ. සන්නද්ධ ක්‍රියාකාරිත්වය ද පුද්ගල ඝාතනය ද කරගෙන ගියා ය. එසේ ම ජනතාවට විවිධ නියෝග නිකුත් කිරීම, ඇඳිරි නීතිය පැනවීම හඳුනාගත් වැරදිකරුවන්ට දඬුවම් දීම, විරෝධතා ව්‍යාපාර සංවිධානය කිරීම, කරනු ලැබුවේ මෙම සංවිධානය මගිනි. මේ නිසා රට දැය පරසතුරු උපද්‍රවයන්ගෙන් බේරා ගැනීමේ අරමුණින් යුතු ව සියලු දේශපාලන පක්ෂවල දේශප්‍රේමී කොටස් ඒකාබද්ධ ව දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය ගොඩ නඟා ඇත යන්න අපැහැදිලි කරුණකි. එහෙත් ජ.වි.පෙ. මෙම දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය තම පක්ෂයට අනුබද්ධ එකක් යයි නොපිළිගන්නා ලදී. එහෙත් 1987-1989 ජ.වි.පෙ. සිවිල් අරගල සමයේ අත් අඩංගුවට ගත් 1000 ක පමණ දෙනා දේශප්‍රේමී ව්‍යාපාරයට සම්බන්ධ වූවන් ය (Gunarathna, 1990: 220).

දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ සංවිධාන ව්‍යුහය සකස් වී තිබුණේ ස්පාඤ්ඤයේ බාස් ප්‍රදේශයේ ඊ.ටී.ඒ (ETA) බෙදුම්වාදී ව්‍යාපාරයේ සන්නද්ධ අංශයට සමාන ව ය'(Gunarathna,1990: 20) මෙම සංවිධානයේ නම්, කරන ඊකියාව, පවුල් විස්තර, ජීවත්වන ස්ථාන හෙළි නොවන ආකාරයට සකසා තිබුණි. මෙහි ප්‍රාදේශීය වශයෙන් දේශප්‍රේමී සන්නද්ධ බලකායන් ද පිහිටුවා තිබුණි. බොහෝ විට නියෝග නිකුත් කරනු ලැබුවේ දේශප්‍රේමී ජනතා සන්නද්ධ බලකායන්ගේ ඒකාබද්ධ අණදෙන මූලස්ථානය නමිනි.

දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය නමැති සන්නද්ධ අංශයට අවශ්‍ය අවිආයුධ හා වෙනත් යුධෝපකරණ ලබා ගැනීම සඳහා විවිධ ක්‍රම අනුගමනය කරන ලදී. ආරම්භයේ දී ඒ සඳහා සොරකම් කිරීම සිදු කරන ලදී. තුවක්කු හා පතරොම් එකතු කරමින් පස් දෙනෙකු හා දහ දෙනෙකු අතර කුඩා කණ්ඩායම් සවස 7 සිට පාන්දර 4 දක්වා නිවෙස් කරා ගියහ. ඔවුන් මහමාර්ග යාබද නිවෙස්වලට ගියේ කලාතුරකිනි. ඔවුහු නිතර ම ගියේ වාහන ගමන් කළ නොහැකි කුඩා පාරවල් සහිත නිවෙස්වලට ය. ටී56 වර්ගයේ තුවක්කු හා සාමාන්‍ය තුවක්කු දරා සිටි මේ කණ්ඩායම්වලට දේශපාලන බුද්ධියක් ද විය. එහි සෑම කණ්ඩායමක් ම දිනකට සැතපුම් 8 -10 ත් අතර ප්‍රමාණයක්

ගමන් කොට යුද අවි 15-30 ත් අතර ප්‍රමාණයක් එකතු කර ගන්නා ලදී. නිතරම පාහේ ගමේ පුද්ගලයෙකු මාර්ග උපදේශකයකු වශයෙන් යොදා ගන්නා ලද අතර එකතු කර ගන්නා ලද තුවක්කු පිළිබඳ තොරතුරු ප්‍රදේශයේ සාමාජිකයකු මාර්ගයෙන් සපයා ගන්නා ලදි (රාවය, 1992 ඔක්තෝබර් 4) සොරකම් කරන ලද අවි ආයුධ අතර ස්වයංක්‍රීය ගිනි අවි ද විය. එසේ ම 1987 මාර්තුවල කොතලාවල ආරක්‍ෂක පීඨයෙන් උන්ඩ 35 ක් සමග ටී56 රයිපලයක්ද, පනාගොඩින් උන්ඩ 60 ක් සමග තවත් ටී56 ක් ද මෝදර රොක් හවුස් කඳවුරෙන් තවත් ටී56 ක් වශයෙන් සොරා ගැනීම් ගණනාවක් කරන ලදි (දිසානායක සහ වෙනත් අය, 1993: 71).

සොරා ගැනීම්වලට පමණක් සීමා නොවී පසුව හමුදා කඳවුරුවලට පහර දී අවිආයුධ ලබා ගැනීම ද සිදු කරන ලදී. එයින් ආයුධ පහර ගැනීමට අමතරව තම ශක්තිය ද පෙන්වීමට ගත් උත්සාහයක් විය. ඒ අනුව පළමු ප්‍රහාරය 1987 අප්‍රේල් 1 වන දින මහනුවර පල්ලෙකැලේ හමුදා කඳවුරට එල්ල කරන ලදී. එම ප්‍රහාරයෙන් ටී56 ස්වයංක්‍රිය රයිපල් 12 ක් ද උපයාන්ත්‍රික තුවක්කු (SMG) 7 ක් ද අත්පත් කරගනු ලැබීය (දිසානායක සහ වෙනත් අය, 1993 : 71). මේ ආකාරයට දිගින් දිගට ප්‍රහාර ගණනාවක් ප්‍රබල රජ්‍ය ආරක්‍ෂක මධ්‍යස්ථානවලට එල්ලකර ආයුධ පැහැර ගන්නා ලදි. කඳවුරුවලට පහර දීමේ දී එකී ප්‍රහාර සාර්ථක වීමට ප්‍රබල හේතුවක් වූයේ එම කඳවුරුවල සිටි සෙබළුන්ගේ සහයෝගය ලැබීම යි. එසේ ම හමුදාවෙන් පලා ආ හෝ නිවාඩු දමා පැමිණි අය ප්‍රහාරය එල්ල කොට පසුව තම හමුදා කඳවුරුවලට වාර්තා කර ඇත (රාවය, 1992 ඔක්තෝබර් 4).

මේ අතරතුර 1971 අප්‍රේල් කැරැල්ල සැමරීම සඳහා 1987 අප්‍රේල් 5 කොළඹ කැම්බල් පිටියේ පැවති ජ.වි.පෙ. රැස්වීමක දී රෝහණ විජේවීරගේ කතාවක් කැසට් පටියකින් ප්‍රචාරය කරණ ලදී. එමගින් ප්‍රකාශ වූයේ, ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී රැල්ලක් මතු වී ඇති බවත් ලංකාවේ විප්ලවය ගැබ්බර වී ඇති බවත් අප දැන් එළඹ සිටින්නේ අරගලයේ 11 වන පියවට බවත් ය (Gunarathna , 1990: 221). මෙකී ප්‍රකාශය එක් අතකින් සමාජයේ මනෝ මූලික සාධක පෝෂණය කිරීමට කළ ප්‍රකාශයක් බව් පැහැදිලි ය. මේ වන විට විප්ලවයකට අවශ්‍ය මනෝ මූලික සාධක සංවර්ධනය කරනු වස් ජ.වි.පෙ. විසින් විමුක්ති ගී නම් ප්‍රසංග මාලාවක් උපයෝගී කර ගනු ලැබී ය. 1987 ජුනි සිට 1987 දෙසැම්බර් දක්වා ප්‍රසංග 250 ක් පවත්වා සාර්ථක ව ජ.වි.පෙ. තම අරමුණ ඉටුකර ගන්නා ලදී. මේ සඳහා සහයෝගයක් ජනතාවගෙන් ද ලැබී ඇත (Chandraprema, 1991: 112).

1987 ජූලි 29 පමණ වන විට මෙරට තවත් දේශපාලන අර්බුදයක් නිර්මාණය වෙමින් පැවතුනි. ඒ මෙතෙක් අප රටට පමණක් සීමා වී තිබූ ජනවාර්ගික අර්බුදය ජාත්‍යන්තරීකරණය වී තිබීම යි. මේ වනවිට ලංකාවේ අභ්‍යන්තර ප්‍රශ්නවලට විදේශීය රාජ්‍යයන් මැදිහත් වෙමින් සිටින ලදී. ඒ අතර අසල්වැසි ඉන්දියාව ප්‍රමුඛස්ථානයක් ගන්නා ලදී. මේ තත්වය තුළ ලංකාවට විදේශීය අධිරාජ්‍යවාදී බලපෑම හේතුකොට ගෙන ජ.වි.පෙ. විසින් ඉන්දියානු මැදිහත් වීමටත් ආණ්ඩුව දන ගස්වා අත්සන් කළ

ඉන්දු ලංකා ගිවිසුමටත් එරෙහි ව ප්‍රබලතම අරගලය සිදු කරන ලදී. ඉන්දු ලංකා ගිවිසුමට පෙර සිට ම ජ.වි.පෙ. ඉන්දියානු විරෝධී ප්‍රචාරක ව්‍යාපාරයක් අරඹා තිබුණි. විශේෂයෙන් 1986 ජනවාර්ගික ප්‍රශ්නය විසඳීම සඳහා බලය විමධ්‍යගත කළ යුතු ය යි ආණ්ඩුව ප්‍රකාශ කළවිට එයට ජ.වි.පෙ. " ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ සමග එකතු වී විරුද්ධත්වය ප්‍රකාශ කරන ලදී. ඒ අතරතුර හැඩිගල්ලේ පඤ්ඤාතිස්ස හිමි, බෙල්ලන්විල විමලරත්න හිමි, මාදුලුවාවේ සෝභිත හිමි, විලේගොඩ අරියදේව හිමි යන හිමිවරුන්ගේ සහා දිනේෂ් ගුණවර්ධන, නාත් අමරකෝන්, ප්‍රින්ස් ගුණසේකර හා සංවිධාන 12 ක ගේ සහයෝගයෙන් මව්බිම සුරකීමේ ව්‍යාපාරය, ආරම්භ කරන ලදී. මෙම සංවිධානයට ජ.වි.පෙ. සෝමවංශ අමරසිංහ මෙන්ම ශිෂ්‍ය ව්‍යාපාරය ද බොහෝ සේ සහාය දක්වා ඇත (දිවයින 2007 ජූලි 30). මේ සංවිධානයේ ප්‍රචාරක කටයුතු සම්පූර්ණයෙන්ම ශිෂ්‍ය ව්‍යාපාරය සිදු කර ඇත. ජ.වි.පෙ. උදව් කළ ද මෙම සංවිධානය ස්වාධීන ව කටයුතු කර ඇත (දිවයින, 2007 ජූලි 30). ජ.වි.පෙ. මාදුලුවාවේ සෝභිත හිමි ඇතුළු තවත් හිමිවරු ඒකාබද්ධ ව සිය දෙනාගේ කණ්ඩායමක් ඇතිකර, ඉන්දියාව ගුවනින් ආධාර බෙදීමට එරෙහිව දැඩි ව්‍යාපාරයක් අරඹන ලදී (කාලිංග, 2001: 195).

මේ අතරතුර කාලයේ ආණ්ඩුවේ මර්දනයට යථෝක්ත සංවිධාන එක්වූ අවස්ථාවක් ලෙස 1987 මැයි දිනය හැඳින්විය හැකි ය. 1987 මැයි දින සිදුවීම් ද තරුණයන් කැරලිකාරීත්වයට යොමු කළ තවත් සාධකයකි. 1987 අප්‍රේල් 21 දින පිටකොටුවේ පිපිරී ගිය අධිබලැති බෝම්බයෙන් සිවිල් වැසියන් 200 කට ආසන්න පිරිසක් ඝාතනයට ලක් වීම නිසා පසු දින රජය විසින් 1987 මැයි දිනය තහනම් කර එය මැයි 22 දින සැමරිය යුතු යැයි නියෝග කරන ලදී. මෙකී නියෝගය නො තකා කම්කරු ජනතාව, විශ්වවිද්‍යාලයීය සිසුන් මව්බිම සුරකීමේ ව්‍යාපාරය හා එක්වී 1987 මැයි 1 නාරාහේන්පිට අභයසිංහාරාමයේ රැස්වීමක් පැවැත්වීමට කටයුතු යොදන ලදී. එහි දී සංවිධානය වී තිබූ පෙළපාලියට පොලිසිය ප්‍රහාරයක් එල්ල කරන ලදී. එම ප්‍රහාරයෙන් ලෙස්ලි ලාල් කිරිබත්ගොඩ හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තෙවන වසර කිත්සිරිමෙවන් රණවක ශිෂ්‍යයා ජීවිතක්ෂයට පත්විය (දිවයින, 2007 ඔක්තෝබර් 22).

විශේෂයෙන් 1987 ජුනි 4 දින ඉන්දියාව ගුවනින් ලංකාවට ආහාර හෙළීමෙන් පසු ව දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය මෙහෙයවීම යටතේ රත්මලානේ ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨයට හා කටුනායක ගුවන් තොටුපලට ප්‍රහාර එල්ල කරන ලදී. පසුව ප්‍රහාරය බාර ගනිමින් ප්‍රකාශයක් නිකුත් කළ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය, දේශප්‍රේමී හමුදා හා පොලිස් භටයිනි, නිලධාරීනි, මව්බිම රැකගන්න දේශප්‍රේමීන්ට එක්වන්න, යනුවෙන් 1987 ජූලි 7 ප්‍රකාශයක් නිකුත් කළේ ය. එමගින් කියා සිටියේ,

" අපි කඳවුරුවලට පහර නුදුන්නෙමු. ජූනි 6 දා කටුනායක හෝ රත්මලානේ දී හමුදා කඳවුරුවලට පහර දීමක් සිදුවූයේ නැත. මවබිම රැකීමට සටන් කරන හමුදාවලට පහර දීමට හෝ සෙබළුන් නැසීමට අවශ්‍ය ව ඇත්තේ ජයවර්ධනට මිස අපට නොවේ. ඉන්දීය ආක්‍රමණිකයාත් ඊලම් ත්‍රස්තවාදියාත් හමුවේ ජයවර්ධන පලා යද්දී මව්බිම රැක ගැනීම යි අපට අවශ්‍යව ඇත්තේ ඒ සඳහා දිවි පුදන හමුදාවත් දේශප්‍රේමී

ජනතා ව්‍යාපාරයත් දැන් ලක් මවට ඇත. අපේ විරෝදාර සගයන් දිවි නොතකා ගුවන් හමුදා කඳවුර යටත් කර ගැනීමට ඉදිරිපත් වූයේ ඉන්දීය ආක්‍රමණිකයා හමුවේ මුළු ගැන්වූ මව්බිමේ ආරක්‍ෂාවට නොයෙදවූ ගුවන් ප්‍රහාරක අවි ලබා ගනු පිණිසය. ඒවායින් මව්බිමේ නිදහස ආරක්‍ෂා කරනු පිණිසය. සෙබළුන් නැසීමට හෝ පහරදීමට එදා මෙන් ම අදත් මතුදාත් අපි කටයුතු නොකරමු. යම් හෙයකින් ආරක්‍ෂක පියවරක දී කිසිවකුට අනතුරක් සිදු වුවහොත් ඒ ගැන අතිශයින් කණගාටු වන අපි ඔහුගේ පෞද්ගලික වගකීම බාර ගන්නා බව සහතික කරමු (දිසානායක සහ වෙනත් අය, 1993: 75 -76) යනුවෙනි.

මෙතෙක් වර්ධනය වෙමින් පැවති විරෝධතා අරගලවල උච්ච අවස්ථාව එළඹෙනුයේ 1987 ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කිරීම ශ්‍රී ලංකාවට ඉන්දියානු මැදිහත්වීම සහ ඉන්දියානු සාම සාධක හමුදා මෙරටට ගෙන ඒම යන කරුණු මත ය. 1987 අරගලකාරී මාවතකට තරුණයන් ඇද දැමීමට බලපෑ ආසන්නතම හේතුව මෙය විය. මෙයින් පසු ජ.වි.පෙ. මතවාදය සම්පූර්ණයෙන් ම වෙනස් විය. 1987 අග භාගයෙන් පසු ජ.වි.පෙ. සිය සාමාජිකයන් දැනුවත් කිරීම සඳහා පන්ති පහ, මතවාදය වෙනුවට පන්ති හතරේ අධ්‍යාපන ක්‍රමය හඳුන්වා දෙන ලදී. එනම්,

(1) අප මාතෘ භූමිය විදේශ ආක්‍රමණයකට ගොදුරු වී ඇත.
(2) ආක්‍රමණිකයා විසින් අර්බුදය වඩාත් උග්‍ර කර ඇත.
(3) මෙම ආක්‍රමණිකයාගෙන් මව්බිම නිදහස් කර ගත යුතු ය.
(4) දේශප්‍රේමී අරගලයට නායකත්වය දිය හැක්කේ ජනතා විමුක්ති පෙරමුණට පමණි (දිසානායක සහ වෙනත් අය 1993: 80).

මෙම පන්ති හතරින් පොදුවේ විදේශ ආක්‍රමණිකයා පිළිබඳ කතා කරන ලදී. මේ හරහා ජ.වි.පෙ. සිය මතයන් ජනතාව ඉදිරියේ තහවුරු කිරීමට උත්සහ ගන්නා ලදී. කෙසේ හෝ 1987 ජුලි 29 දින අත්සන් කරන ලද ඉන්දු ලංකා ගිවිසුමට එරෙහි ව මෙරට අරගල කළ සංවිධාන පක්‍ෂ අතර ජ.වි.පෙ. ඉදිරියෙන් ම විය. විටෙක ජේ.ආර්. ජයවර්ධන මහතාගේ චරිත කතාව සම්පාදනය කර ඇති මහාචාර්ය කිංස්ලි ද සිල්වා හා හෝවාඩ් ඩිරිගින්ස් මෙම විරෝධතාව ලංකාවට නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ දක්නට ලැබුනු ප්‍රබලතම රාජ්‍ය විරෝධි නැගිටීම බව හඳුන්වා දී ඇත (දිවයින, 2008 ජුනි 9). මෙම විරෝධතාව ගුරුවරුන්, ලිපිකරුවන්, ශිෂ්‍යයන්, වෙළඳුන්, භික්‍ෂූන්, එකතු කරගෙන දියත් කරන ලද එකක් විය. එහි දී 1987 ඉන්දු ලංකා ගිවිසුම හරහා ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වය උල්ලංඝණය වී ඇති බව පවසමින් ජ.වි.පෙ. මව්බිමේ ස්වාධීනත්වය ආරක්‍ෂා කොට තහවුරු කිරීම අරමුණු කරන්නේ යයි පවසමින් සිය අරගලය පෙරට ගෙන යන ලදී. මෙම කාලයේ ජ.වි.පෙ. සටන් පාඨයන් වූයේ,

- "පළමු ව මව්බිම"
- "මව්බිම නැත්නම් මරණය"
- "මව්බිමට එරෙහි ව ද්‍රෝහීන්ට මරණය"
- "මව්බිමේ සියලු සතුරන්ට මරණය ජනතාවට නිදහස හා සමාජවාදය"

( දිසානායක සහ වෙනත් අය, 1993: 83 )යන්න යි.

ඉන්දු ලංකා ගිවිසුමට එරෙහි ව ජ.වි.පෙ. කළ අරගලයේ ප්‍රබලතම සිදුවීම වූයේ 1987 අගෝස්තු 18 දින කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ පැවති ආණ්ඩු පක්ෂ රැස්වීමකට එල්ල කළ බෝම්බ ප්‍රහාරය යි. ජනාධිපතිවරයා ඉලක්ක කරගෙන එල්ල කළත් ඔහු ගැලවී ලලිත් ඇතුලත්මුදලි බරපතළ තුවාල ලබන ලදී. ප්‍රහාරයෙන් පසු එකී ප්‍රහාරයේ වගකීම බාර ගනිමින් දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය "ද්‍රෝහීනි, අප තොපට බෝම්බ ගැසුවේ මේ නිසයි", යනුවෙන් පත්‍රිකාවක් නිකුත් කරන ලදී. එහි දී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාට එරෙහි ව චෝදනා ගණනාවක් ඉදිරිපත් කරනු ලැබි ය. එම පත්‍රිකාව හරහා ජීවත් වීමට ආසා ඇති සියලු ම මන්ත්‍රීන් තම ආසනවලින් ඉල්ලා අස්වී තම වැරදි පාපෝච්ඡාරණය කළ යුතු බවත් ජයවර්ධන ජනාධිපතිට එරෙහි ව නැගී සිටිය යුතු බවත් ප්‍රකාශ විණි (දිසානායක සහ වෙනත් අය,. 1993: 78).

ඊට අමතර ව ජ.වි.පෙ. මැදිහත් වීම මත රටපුරා කළු කොඩි ඔසවා නොයෙක් ආකාරයේ රාජ්‍ය විරෝධී ක්‍රියා සිදු කරන ලදී. මෙහි දී රාජ්‍ය දේපළ විනාශ කිරීම රාජ්‍ය විරෝධී පෝස්ටර් හා පත්‍රිකා බෙදා හැරීම ආදී ක්‍රියා මාර්ග අනුගමනය කරන ලදි. මෙම ව්‍යාපාරවල දී අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලය, දේශප්‍රේමී භික්ෂු පෙරමුණ, අන්තර් විශ්වවිද්‍යාලයීය භික්ෂු බල මණ්ඩලය යන සංවිධාන නායකත්වය ගෙන ක්‍රියා කරන ලදී. මේ සඳහා විපක්ෂයේ ද සහාය ලැබුණි. එහි දී 1987 ජුලි 24 රොස්මිඩ් පෙදෙසින් නිකුත් වූ පත්‍රිකාවක් මගින් ගිවිසුමට විරෝධය දැක්වීම සඳහා ජුලි 28 දා පෙරවරු 8 ට කොළඹ කොටුවේ දුම්රිය ස්ථානය ඉදිරිපිට පැවැත්වෙන රැස්වීමට සහභාගී වන මෙන් සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය ජනතාවගෙන් ඉල්ලා සිටියා ය (කාලිංග, 2001: 196) මෙම අරගලයට මව්බිම සුරැකීමේ ව්‍යාපාරය ද සහාය දක්වන ලදී.

1987 ජුලි 28 සිට 1987 අගෝස්තු 2 අතර කාලයේ ජ.වි.පෙ. මූලිකත්වයෙන් හා අනිකුත් සංවිධාන විසින් සාම ගිවිසුමට එරෙහි ව කඩාකප්පල්කාරී සිද්ධීන් ඇතුළු රජයේ හා සංස්ථා ගොඩනැගිලි 529 ට අලාභ හානි සිදු කිරීමත් මෙ හිදී සිදුවිය. මේවාට පළාත් සභා උපදිසාපති කන්තෝරු 42 ක්, දුම්රිය ස්ථාන 47 ක්, දුම්රිය පාරවල් හා ලොකු බෝක්කු ද ඇතුළත් විය. රජයේ හා පෞද්ගලික බස් 1005 කට අලාභහානි සිදු කළ අතර බොහෝ ප්‍රමාණයක් ගිනි තබා විනාශ කරන ලදී. මෙයට ගමනා ගමන මණ්ඩලයේ බස්රථ 500 කට වැඩි ප්‍රමාණයක් ඇතුළත් විය. පෞද්ගලික දේපලවලට හානි සිදුවූ සිද්ධීන් 187 ක් විය. විදුලි කණු හා ට්‍රාන්ස්පෝමර් 180 කට හානි සිදු කෙරිණි. සොරකම් 567 ක් සිදුවිය. සාමාන්‍ය තුවක්කු 321 ක් පැහැර ගැනීම ද වෙනත් සොරකම් ද මීට ඇතුළත් විය (ආරියසේන, 2000: 6970).

1987 ඉන්දු ලංකා ගිවිසුමෙන් පසුව මෙරටට සාම සාධක හමුදාව පැමිණීමත් සමග ජ.වි.පෙ. ක්‍රියාකාරිත්වය තවත් උග්‍ර විය. එවිට ඔවුන්ගේ පන්ති හතරේ මතවාදය ද වෙනස් විය. එහි දී ඉන්දියානු ව්‍යාප්ත වාදයෙන් මව්බිම ආරක්ෂා කර ගැනීම පන්තියේ දී ඉන්දියානු ආක්‍රමණයක් පිළිබඳ ව ද අදහස් දක්වන ලදී. මේ බව ජ. වි. පෙ.

නායකයා පෙන්වා දෙන්නේ පළමු ව ඉන්දියාව සිය අභිමතය පරිදි ශ්‍රී ලංකාවේ විදේශ සම්බන්ධතා පාලනය කරයි. දෙවනු ව තම හමුදාව යෙදවීමේ නීත්‍යනුකූල අයිතිය ලබාගෙන ඇත. තෙවනු ව ඉන්දියාව තමන්ට අවශ්‍ය ආකාරයට ශ්‍රී ලංකාවේ ආර්ථික සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ අයිතිය ලබාගෙන ඇත. සිව්වනු ව උතුරු නැගෙනහිර ප්‍රදේශය ඉන්දියානු ප්‍රාන්තයක් බවට පත් කර ගෙන ඇත. පස්වෙනු ව උතුරු නැගෙනහිර ප්‍රදේශ දෙමළ වාර්ගික ප්‍රදේශයක් නිර්මාණය වේ. හයවෙනු ව ඉන්දියාව ජයවර්ධන තම ග්‍රහණයට ගෙන ශ්‍රී ලංකාව පරාධීන රාජ්‍යයක් බවට පත් කළේ ය, වශයෙනි (රාවය, 1992 මාර්තු 15).

ජ.වි.පෙ. මූලික අධිෂ්ඨානය වූයේ පැවති ධනවාදී රාමුව වෙනස් කර සමාජවාදී රාමුව ලංකාවේ ක්‍රියාත්මක කිරීමට බලය ලබා ගැනීම ය. 1987 පමණ වන විට එකී අභිප්‍රාය යම් තරමකට සංශෝධනයකට ලක් වූ බවත් පෙනෙයි. එනම් පළමු ව ලංකාවේ දේශප්‍රේමී අරගලයක් කර එය මත පදනම් වී සමාජවාදය ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීමය. මෙකී අභිප්‍රාය මත ඔවුන් පළමුව දේශප්‍රේමී අරගලයක් සිදු කිරීමට අදාළ අවශ්‍යතාවන් සම්පූර්ණ කරන ලදී.

මේ අනුව 1988 වසර එළඹුමේ දී ජ.වි.පෙ. ප්‍රමුඛ මෙරට තරුණයන් පැවති රජයට හා ක්‍රමයට එරෙහි ව නැගීසිටීමට අදාළ පසුබිම සකස් කරගෙන තිබුණි. පොදුවේ මෙතෙක් සාකච්ඡා කරන ලද කාරණා එකින් එක බද්ධ ව අවසන් ප්‍රතිඵලයක් වශයෙන් 1988-1989 කැරැල්ල සිදුවිය. මේ කැරැල්ල 1971 අරගලය මෙන් අප්‍රේල් 05 වෙනිදා වැනි නිශ්චිත දිනයක ආරම්භ නොවී ය. 1988-1989 යනු ජ.වි.පෙ. මෙතෙක් අප සාකච්ඡා කරන ලද සංවිධාන ශක්තිය උපයෝගී කරගනිමින් ප්‍රබල ආයුධ සන්නද්ධ අරගලයක් උපරිමයෙන් සිදුකර රාජ්‍ය බලය අත්පත් කර ගැනීමට දැරූ දෙවර්ෂයකි.

මෙකී දෙවර්ෂය තුළ සිදුවූ සියල්ල 1988-1989 අරගලය වශයෙන් පොදුවේ හඳුන්වා දෙනු ලැබේ. මෙකී අරගලයේ අවසානයත් මෙම වසර දෙක අවසානයේ ම රැඳී ඇති හෙයින් ද මෙය 1988-1989 අරගලය වශයෙන් හඳුන්වා දෙනු ලැබේ.

## නිගමනය

මෙතෙක් 1988-1989 අරගලයට සම්බන්ධ හේතු සාධක නිමාවක් දැකිය නොහැකි ය. එකී හේතු දීර්ඝ කාලීන ව මෙන් ම කෙටි කාලීන ව අපට දැකි ය හැකි ය. විශේෂයෙන් මෙම අධ්‍යයනය තුළ දී අප විසින් සලකා බලනු ලැබුයේ 1988-1989 අරගලයට බලපාන ලද දේශපාලනික කරුණු පමණි. එහි දී අපට අවබොධ වූ කරුණු කිහිපයක් වේ, ඉන් එකක් නම් මෙරට තරුණයන් මුල දී ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයට විරුද්ධ වූ බව යි. අනෙක ඔවුන් එය වෙනස් කිරීමට ගත් උත්සාහ ගැනීමත්, එය අසාර්ථක වීමෙන් පසු යළි එම මාවතේ ම ගමන් කිරීමට උත්සාහ ගැනීමත් ය. එහෙත් 1980

දශකයෙන් පසු එකී ගමන් මග ඔවුන් විසින් ම යළි වෙනස්කර ගන්නා ලදී. ඒ සඳහා බලපාන ලද හේතු එකින් එක සාකච්ඡා කරන ලදි. මෙහි දී අප විසින් අවබෝධ කර ගත යුත්තේ 1988-1989 අරගලයට දේශපාලනික හේතු පමණක් නොව මෙවැනි නැගී සිටීමකට නැත්නම් ප්‍රචණ්ඩකාරී හැසිරීමකට ආර්ථිකමය සිද්ධි ද බලපානු ලබයි. ඒ අනුව විරැකියා ගැටළුව, ආර්ථිකය දියුණු නොවීම, රැකියා අවස්ථා බහුල වීම යනාදී ගැටළු ද බලපානු ලබයි.

ඒ අනුව සමස්තයක් වශයෙන් ගත්විට 1988-1989 අරගලයට එක් ප්‍රධාන හේතුවක් බලපෑවේ ය යන්න කිව නොහැකි ය. 1988-1989 අරගලයට බලපාන ලද හේතු කාරණා සාකච්ඡා කරන බොහෝ දෙනාගේ අදහස වනුයේ තරුණ අසහනය ඊට හේතු වූ බව යි. තරුණ නැගීසිටීමක් ප්‍රචණ්ඩ දේශපාලන ව්‍යාපාරයක් වශයෙන් ක්‍රියාත්මක වීමේ දී එයට බහුතරයක් තරුණයන් එකතු විම හේතු කොට ගෙන එය තරුණ අසහනය මුල් කොට ගෙන ම ඇති වූවක් වශයෙන් හුවා දැක්වීම නිවැරදි නොවන්නක් සේම පිළිගත නො හැක්කකි. සාමාන්‍යයෙන් මෙවැනි අවස්ථාවක පමණක් නොව වෙනත් සටන්කාමී අවස්ථාවක දී පවා තරුණයන් පෙරට ඒම ස්වාභාවික ව සිදු වන්නකි. මෙවැනි තරුණ නැගීසිටීමකට බලපාන්නා වූ ප්‍රශ්න තරුණියන්ට පමණක් සීමා වූ ප්‍රශ්න ලෙස සැලකීම ද නොකළ යුත්තකි. මෙකී ප්‍රශ්න බාල, තරුණ මහලු යන සෑම තරාතිරමකට ම අයත් අයට බලපානු ලබයි. ඒ අනු ව එකී හේතුන්ට ආයුධවලින් ක්ෂණික ව ප්‍රතිචාර දැකවීම මත 1988-1989 අරගලය සමස්තයක් ලෙස ඇතිවූ බව මෙහි දී කිව හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රයෝ


අලස් ඒ.සී. (1978) 71 කැරැල්ල, සී. ස ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම.

අරගල (1971 -1988, 1989) පිළිබඳ ස්වයං විවේචන සහ මාක්ස්වාදය දෙස ආපසු හැරී බැලීමක් (1988) ජන විමුක්ති සහයෝගිතා පදනම.

ආරියසේන සම්පත් (2000) 80 දශකයෙහි සිංහල තරුණ කැරැල්ලේ ප්‍රචණ්ඩ පසුබිම, නන්දන මාරසිංහ අනුස්මරණ ග්‍රන්ථ ප්‍රකාශන සමාගම.

කාලිංග කපිල කුමාර (පරි) (2001) අසල්වැසියාගේ සාම සවාරිය, සංහිඳ මුද්‍රණ හා ප්‍රකාශකයෝ.

ගුණසේකර ජේ.ආර්. (2000) 1971 1989 අභිමි වූ පරපුර, ඒ.එස්. ප්‍රකාශකයෝ.

දිවයින (1986 අප්‍රේල් 16) කොළඹ, උපාලි පුවත්පත් සමාගම.

දිවයින (2007 ජූලි 30) කොළඹ, උපාලි පුවත්පත් සමාගම.

දිවයින (2007 ඔක්තොබර් 22) කොළඹ, උපාලි පුවත්පත් සමාගම.

දිවයින (2008 ජූනි 09) කොළඹ, උපාලි පුවත්පත් සමාගම.

දිසානායක වසන්ත සහ වෙනත් අය (1993) ජ.වි.පෙ. ප්‍රභවය විකාශය සහා දේශපාලනය, රාජගිරිය, දියැස ප්‍රකාශන.

පුනරුත්ථාපනය කළ තරුණයන්ගේ තොරතුරු (1990) තරුණ පුනරුත්ථාපන කොමසාරිස් කාර්යාලය.

රාවය (1992 අප්‍රේල් 05) ගල්කිස්ස, රාවය පුවත්පත් සමාගම.

රාවය ( 1992අප්‍රේල් 26) ගල්කිස්ස, රාවය පුවත්පත් සමාගම.

රාවය (1992 මාර්තු 15) ගල්කිස්ස, රාවය පුවත්පත් සමාගම.

රාවය (1992මාර්තු 22) ගල්කිස්ස, රාවය පුවත්පත් සමාගම.

රාවය (1992 ජූනි 14) ගල්කිස්ස, රාවය පුවත්පත් සමාගම.

රාවය (1992 ජූනි 28) ගල්කිස්ස, රාවය පුවත්පත් සමාගම.

රාවය (1992 ජූලි 19) ගල්කිස්ස, රාවය පුවත්පත් සමාගම.

රාවය (1992 ඔක්තොබර් 04) ගල්කිස්ස, රාවය පුවත්පත් සමාගම.

ලංකාදීප (1991 ජූනි 28) කොළඹ, විජය පුවත්පත් සමාගම.

Chandraprema, C.H. (1991) Sri Lanka:The Year 08 Terror JVP Insurrection 1987-1989, Colombo, Lake House Invesment Ltd.

Dissanayaka, T.D.S.A. (1994) The Politic of Sri Lanka, Colombo, Sasaktika Pvt

Gunarathna, R. (1990) Sri lanka A Lost Revolotion, The Story Of The J.V.P Colombo, Institution Of Fundamental Studies.

Senarathna, J.P. (1987) Political Violence in Sri Lanka 1977-1990 Amasterdam, University Press.